# රණවිරුවා

2020 ඔක්තෝබර් • 222 කලාපය

## උපන්බිම රකින මෙහෙයට උතුම් ආශිර්වාද...



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.



# 71 වන යුද්ධ හමුදා සංවත්සරය නිමිත්තෙන් යුද්ධ හමුදා ධජයන්ට සෙත්පතයි...

71 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව සංවිධානය කෙරුණු යුද්ධ හමුදා ධජයන්ට සෙත් පැතීමේ ආගමික උත්සව මාලාව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් මහනුවර ශ්‍රී දළදා මාලිගාව, ඓතිහාසික අනුරාධපුර ජය ශ්‍රී මහා බෝ සමිඳුන් අභියස, කොළඹ 13 ශ්‍රී පොන්නම්බලම් වානේශ්වරම් කෝවිලේදී සහ කොළඹ 03 කොල්ලුපිටිය ජුම්මා ඉස්ලාම් දේවස්ථානයේදී පැවැත්විණ.



ඓතිහාසික අනුරාධපුර ජය ශ්‍රී මහා බෝ සමිඳුන් අභියස පැවති පූජාවට යුද්ධ හමුදාධිපති එක් වූ අවස්ථාව...

යුද්ධ හමුදා මූලස්ථානය, ස්වේච්ඡා බලසේනා මූලස්ථානය, සියලුම ආරක්ෂක සේනා මූලස්ථාන, සියලුම ඉදිරි නඩත්තු පෙදෙස මූලස්ථාන, සේනාංක, බලසේනා, රෙජිමේන්තු, ඒකකයන් සහ යුද්ධ හමුදා පුහුණු පාසල් නියෝජනය කරමින් නිලධාරීන්,  නිලධාරිනියන් මෙන්ම සෙසුනිලයින් මෙම අවස්ථාව සඳහා සහභාගි වූහ.



# මහනුවර ශ්‍රී දළදා මාලිගාවේදී ධජයන්ට සෙත් පැතීමේ ආගමික උත්සවය...









# හින්දු "අභිෂේකම්" පූජාව...



# ඉස්ලාම් ආගමික යාඥාව...









# යුද්ධ හමුදා සංවත්සරය වෙනුවෙන් සර්ව රාත්‍රික "පිරිත් සජ්ඣායනයක්"....

ඔක්තෝබර් 10 වන දිනට යෙදී තිබූ 71 වන යුද්ධ හමුදා සංවත්සරය වෙනුවෙන් සෑම වසරක් පුරාවටම යුද්ධ හමුදා බෞද්ධ බල මණ්ඩලය විසින් සංවිධානය කරනු ලබන සම්ප්‍රදායික බෞද්ධ ආගමික අංගයක් වන සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනය යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දායකත්වයෙන් මෙවරද පසුගිය වප් පුන් පොහෝ දින බුද්ධාලම්බන ප්‍රීතිය දනවන ආකාරයෙන් පැවැත්විණ.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය ඇතුළු යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් සහ යුද්ධ හමුදා සේවයේ නියුතු සියලුම නිලයන් ආවරණය වන පරිදි හටපිරිස් එම අවස්ථාවට එක්ව සිටියහ. එමෙන්ම ඊට පසුදින මහා සංඝරත්නය උදෙසා හීල් දානමය පිංකමක් සහ දහවල් සංඝගත දක්ෂිණාවක් ද පිරිනැමීම සිදුවිය.









# අරමුණ දිනන්නට පෙරමුණේ සිටි විරුවන්ගේ සුවදුක් විමසමින්...

ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී පසුගියදා යෙදී තිබුණු 71 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව අනුරාධපුර අභිමංසල 1 සුවසහන මධ්‍යස්ථානයෙහි සංචාරයක නිරතවිය. එහිදී මාතෘභූමියේ ඒකීයභාවය වෙනුවෙන් සටන්වැදු යුද බිමේදී ඇස්, ඉස්, මස්, ලේ දන්දී රණසෙමිනයට පත්ව නේවාසිකව ප්‍රතිකාර ලබන විරෝදාර රණවිරුවන් 40 දෙනෙකු ගේ සුවදුක් විමසා බලන ලදී. එහිදී ඔවුන් සමඟ සුහදව අදහස් හුවමාරු කරගත් යුද්ධ හමුදාධිපතිතුමන් පියෙකු මෙන් ඔවුන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳ සොයාබලමින් ඔවුන් වෙත ත්‍යාග පාර්සල් පිරිනැමීමටද කටයුතු කළේය.









# ලෝක ළමා දින සැමරුම අරුත්ගන්වන්නට ජනපති ආර්යාවද එක්වෙයි...

යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ළමුන්ගේ සුබසාධන කටයුතු වෙනුවෙන් යුද්ධ හමුදාව වෙතින් කළමණාකරණය කරනු ලබන මැනිං ටවුන් හි පිහිටි "සෙනෙහස" අධ්‍යාපන සම්පත් පර්යේෂණ හා තොරතුරු කේන්ද්‍රයේදී ලෝක ළමා දිනය සනිටුහන් කරමින් සංවිධානය කෙරුණු වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 01 වන දින පැවැත්විණ. එහි ප්‍රධාන ආරාධිතයා ලෙස ජනාධිපති ආර්යා අයෝමා රාජපක්ෂ මහත්මිය සහභාගී වූ අතර, එම අවස්ථාවට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය, නාවික හමුදාධිපති නිශාන්ත උළුගේතැන්න සහ නාවික හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි චන්දිමා උළුගේතැන්න මහත්මිය, ගුවන් හමුදාධිපති එයාර් මාර්ෂල් සුමංගල ඩයස් සහ ගුවන් හමුදා සේවා වනිතා ශඛාවේ සභාපතිනි මයුරි ප්‍රභාවි ඩයස් මහත්මිය ඇතුළු බොහෝ පිරිසක් සහභාගී වූහ.

උත්සවයේ වැඩ කටයුතු ආරම්භ කරමින් එම මධ්‍යස්ථානයේ ඉගෙනුම ලබන දරු දැරියන් විසින් ආරාධිත අමුත්තන් අභිමුවදී සෞන්දර්යාත්මක කුසලතා එළිදැක්වූ අතර, මෙදින ප්‍රධාන ආරාධිත අමුත්තිය විසින් "සෙනෙහස" අධ්‍යාපන සම්පත් පර්යේෂණ හා තොරතුරු කේන්ද්‍රයේ නිල වෙබ් අඩවිය ද ආරම්භ කරනු ලැබීය.





# "යුද්ධ හමුදාධිපති ලීග් විස්සයි විස්ස"




"යුද්ධ හමුදාධිපති ලීග් විස්සයි විස්ස" ක්‍රිකට් තරගාවලියේ අවසන් මහා තරගය ඉකුත් ඔක්තෝබර් 17 වන දින සන්ධ්‍යාවේ දොඹගොඩ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී පැවැත්විණ. එහිදී සීක්කුගේ ප්‍රසන්නගේ නායකත්වයෙන් යුත් *Army Nothern Warriors* කණ්ඩායම සහ දිනේෂ් චන්දිමාල් ගේ නායකත්වයෙන් යුත් *Army Southern Warriors* කණ්ඩායම දොඹගොඩ යුද්ධ හමුදා ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී අවසන් මහා තරගයට තරඟවැදුණු අතර, නිසි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුකූලව තරගාවලියේ අවසන් මහා තරගය පැවැත්විණි.

උණුසුම් තරගයකින් අනතුරුව තරගාවලියේ ශූරතාවය හිමිකර ගැනීමට *Army Southern Warriors* කණ්ඩායම සමත් වූ අතර, එහි අනුශූරතාවය *Army Nothern Warriors* කණ්ඩායමට හිමිවූහ. ත්‍යාග ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය.



# සිංහපුරට අඹ සෙවණක්...



71 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව අක්කර 1100 කින් සමන්විත සිංහපුර යුද්ධ හමුදා ගොවිපළෙහි ටී.ජේ.සී (*TJC*) අඹ පැළ රෝපණය කිරීමේ දැවැන්ත ව්‍යාපෘතියක් ඉකුත් සැප්තැම්බර් 29 වන දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලදී.

මෙම අවස්ථාවට සපැමිණි යුද්ධ හමුදාධිපතිතුමන් සිංහපුර ගොවිපළ නිරීක්ෂණය කිරීමෙන් පසුව ටී.ජේ.සී (*TJC*) අඹ පැළ 20,000 ක් රෝපණය කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස පැළ 5000 ක් රෝපණය කිරීමේ අදියර ආගමික වතාවත් මධ්‍යයේ ආරම්භ කරන ලදී.

ඉන් අනතුරුව යුද්ධ හමුදාධිපතිතුමන් මෙම ගොවිපළ පරිශ්‍රයෙහි ඉදිකිරීමට නියමිත ජල මූලාශ්‍ර දෙකක් වන "සෙබල වැව" සහ "ගජබා වැව" සඳහා යෝජිත ප්‍රදේශයන් නිරීක්ෂණය කළ අතර, එහි කටයුතු ආරම්භයද සනිටුහන් කරන ලදී.

මෙම සමාරම්භක අවස්ථාව සඳහා ගජබා රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක, පදවි - ශ්‍රීපුර සහකාර ප්‍රාදේශීය ලේකම්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ඉඩම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ප්‍රාදේශීය නිලධාරීන්, 9 වන ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද සහභාගී වූහ.




# භටකාර්ය සම්පාදන මාණ්ඩලික නිලධාරී පාඨමාලා අංක - 06 සාර්ථකව විසිර යයි...

පුරා වසරක කාලයක් ත්‍රිකුණාමලය භටකාර්ය සම්පාදන විද්‍යාලයේ (ASL) දී පැවති භටකාර්ය සම්පාදන මාණ්ඩලික නිලධාරී පාඨමාලා අංක - 06 සාර්ථකව හැදෑරූ දේශීය හා විදේශීය හමුදා සාමාජිකයින් 35 දෙනෙකු වෙත උපාධි සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සවය පසුගිය සැප්තැම්බර් 22 වන දින කොළඹ ආරක්‍ෂක සේවා විද්‍යාල ශ්‍රවණාගාරයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මෙවර පාඨමාලාවට යුද්ධ හමුදා නිලධාරීන්ට අමතරව ගුවන් හා නාවික නිලධාරීන් දෙදෙනෙකුද බංගලාදේශය, පාකිස්ථානය, සැම්බියාව ඇතුළු රටවල් නියෝජනය කරමින් ද නිලධාරීන් සහ නිලධාරිනියන් සහභාගී වූහ. මෙම අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ භටකාර්ය සම්පාදන විද්‍යාලයේ සේනාවිධායක ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද එක්වූහ.



# කිළිනොච්චියේ කොවිඩ් රෝහල යුද්ධ හමුදාධිපතිගේ නිරීක්ෂණයට...

කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ කටයුතුවලට අදාළව දිවයින පුරා සිදුකරනු ලබන මෙහෙයුම්වල ප්‍රගතිය පරීක්‍ෂා කිරීමේ අරමුණු පෙරදැරිව කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී, ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් ඔක්තෝබර් 31 වන දින කිළිනොච්චි ක්‍රිෂ්ණපුරම්හි ඉදිකරමින් පවතින කොවිඩ් රෝහලේ නිරීක්‍ෂණ චාරිකාවක නිරතවිය.

ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ආර්එම්පීජේ රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ උණුසුම් පිළිගැනීම මධ්‍යයේ එහි සම්ප්‍රාප්ත වූ යුද්ධ හමුදාධිපතිතුමන් ආරක්‍ෂක සේනා මූලස්ථානය (කිළිනොච්චිය) යටතේ රාජකාරියේ නියුතු සියලු නිලයින් අමතන්නටද අමතක නොකළේය.

# කළ මෙහෙයට බුහුමන්...

විශ්‍රාම දිවියට පා තබන ගුවන් හමුදාධිපති එයාර් මාර්ෂල් සුමංගල ඩයස් සිය ධුරයෙන් නික්ම යාමට ප්‍රථම ඉකුත් සැප්තැම්බර් 28 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය. එම සුහද හමුව අවසානයේ යුද්ධ හමුදාධිපති විසින් විශ්‍රාම ලබන ගුවන් හමුදාධිපති වෙත සුබ පැතුම් එක්කරමින් විශේෂ සමරු තිළිණයක්ද ප්‍රදානය කරන ලදී.



# 2020 - 2025 ඉදිරි උපාය මාර්ගික කෙටුම්පත ඉදිරිපත් කෙරේ...



ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙනස්වන බහුවිධ හා ගෝලීය තර්ජනයන් හඳුනාගනිමින් ඒවාට අනුවර්තනයවීමේ අවශ්‍යතාව මත ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් මත සකස් කළ 2020 - 2025 ඉදිරි උපාය මාර්ගික සැලසුමේ පළමු කෙටුම්පත ඉකුත් ඔක්තෝබර් 08 දින යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී හිටපු යුද්ධ හමුදාධිපතිවරුන් වෙත ඉදිරිපත් කරන ලදී.

මෙම අවස්ථාවට විශ්‍රාමික යුද්ධ හමුදාධිපතිවරුන් වන ජෙනරාල් (විශ්‍රාමික) ශ්‍රීලාල් වීරසූරිය, ජෙනරාල් (විශ්‍රාමික) ශාන්ත කෝට්ටේගොඩ, ජෙනරාල් (විශ්‍රාමික) ජගත් ජයසූරිය සහ ජෙනරාල් (විශ්‍රාමික) දයා රත්නායක යන මහත්වරු සහභාගී වූහ. ආරක්‍ෂක ප්‍රගමනය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරමින් යුද්ධ හමුදාවේ ව්‍යුහය, නිලධාරීන්ගේ ප්‍රගමනය, යුද්ධ හමුදා සංවිධානය සහ ස්වේච්ඡා බලසේනාව ආදිය තුළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2020-2025 වර්ෂ සඳහා වන උපාය මාර්ගික සැලසුම් ඊට ඇතුළත්ය.

# කොරෝනා මැඩලීමට පරිත්‍යාග...






කොවිඩ් 19 වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාව සිදුකරනු ලබන දැවැන්ත කාර්යභාරය පිළිබඳ අවධානය යොමුකළ කොරියානු ජනතාව සිය ලබැඳියාව තහවුරු කරමින් කොරියානු ජනරජයේ ශ්‍රී ලංකා තානාපති අතිගරු වුන්ජින් ජියොන්ග් මහතා ඉකුත් ඔක්තෝබර් 14 වන දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත කොවිඩ් 19 වෛරසය පාලනය කිරීමට කැපවී සිටින සියලුම ආරක්ෂක හමුදා සාමාජිකයින් සහ සෞඛ්‍ය අංශ නිලධාරීන් අතර බෙදාදීම සඳහා මුඛ ආවරණ තොගයක් පරිත්‍යාග කරන ලදී.




කොවිඩ් 19 පැතිරීම වැළැක්වීම සඳහා යුද්ධ හමුදාව විසින් සිදුකරනු ලබන දැවැන්ත කාර්යභාරය අගය කරමින් සිලෝන් බිස්කට් සමාගම විසින් වෛරසය පැතිරීම වැළැක්වීමේ රාජකාරිවල නිරත වී සිටින යුද්ධ හමුදා සාමාජිකයින් අතර බෙදාහැරීම සඳහා බිස්කට් තොගයක් ඉකුත් ඔක්තෝබර් 11 වන දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත යුද්ධ හමුදා මූලස්ථානයේදී පරිත්‍යාග කරනු ලැබීය. මෙම අවස්ථාවට සිලෝන් බිස්කට් සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමණාකරු මහේෂ් අනුරුද්ධ, අලෙවි කළමණාකරු ජයතිලක, අලෙවිකරණ සාමාන්‍යාධිකාරී ජනමේජ් පෝල් ඇන්තනී යන මහත්වරු ඇතුළු එම සමාගමේ නිලධාරීන් කිහිපදෙනෙකු එක්වූහ.

# අභිමත් ගමනකට උණුසුම් සුබපැතුම්...



71 වන යුද්ධ හමුදා සංවත්සර දිනය වෙනුවෙන් මේජර් ජෙනරාල් නිලයට උසස් කරනු ලැබූ යුද්ධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ බ්‍රිගේඩියර්වරු නවදෙනෙකුට නිල ලාංඡන පැළඳවීම ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් සිය උණුසුම් සුබ පැතුම් මධ්‍යයේ පසුගියදා සිදුකෙරිණ. එසේ නිල උසස්වීම් ලැබූ මේජර් ජෙනරාල්වරුන් වනුයේ මේජර් ජෙනරාල් ඒපී පල්ලාවෙල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, මේජර් ජෙනරාල් ආර්පීඩියූ රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, මේජර් ජෙනරාල් පීජ්ජේ පීරිස් එන්ඩියූ, මේජර් ජෙනරාල් පීජේපී ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, මේජර් ජෙනරාල් එස්එම්එස්පීබී සමරකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, මේජර් ජෙනරාල් ඩීඑම්ටී දිසානායක ආර්එස්පී සහ මේජර් ජෙනරාල් ආර් ගනේගොඩ පීඑස්සී යන නිලධාරීන්ය. සිය වෘත්තීය දිවියේ අභිමානවත් කඩඉමක් පසුකළ එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට "රණවිරුවාද" මෙසේ සුබ පැතුම් එක්කරයි.



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 71 වන සංවත්සර දිනයට සමගාමීව කීර්තිමත් ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩකයින් දෙදෙනකු වන තිසර පෙරේරා සහ දිනේෂ් චන්දිමාල් ඉකුත් ඔක්තෝබර් 09 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලයේ පැවති කෙටි උත්සවයකදී මේජර් නිලයෙන් පිදුම් ලබන ලදී. ඔවුන්ට නිල ලාංඡන පැළඳවීම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් සිදුකෙරිණ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවට අනුයුක්තව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එක්වූ එම ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩකයින් අතරින් මේජර් තිසර පෙරේරා ගජබා රෙජිමේන්තුව නියෝජනය කරමින් ද මේජර් දිනේෂ් චන්දිමාල් ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය නියෝජනය කරමින් ද ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රිකට් කණ්ඩායම වෙත දායකත්වය ලබාදෙති.




# "KIOSK SHOP"

## වෙළඳසැල
## සෙබළුන්ගේ අයිතියට පත්කරයි...







සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මියගේ සංකල්පයකට අනුව යුද්ධ හමුදා මූලස්ථානය තුළ රාජකාරි කරනු ලබන නිලධාරීන් හා සෙසුනිලයින්ගේ නිල ඇඳුම් ආයිත්තම්/ශාරීරික අභ්‍යාස ඇඳුම් හා සිවිල් සේවක මහත්ම මහත්මීන් සඳහා අවැසි සුවඳ විලවුන්, නිමි ඇඳුම්, ලිපිද්‍රව්‍ය ඇතුළු අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් සේවා වනිතා ඒකකය මගින් "*KIOSK SHOP*" නමින් වූ වෙළඳසැලක් යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රය තුළ පසුගියදා ස්ථාපනය කරන ලදී. එම වෙළඳසැල යුද්ධ හමුදාධිපතිතුමන්ගේ හා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනියගේ ආරාධනයෙන් රාජ්‍ය ආරක්‍ෂක අමාත්‍යාංශයේ ගරු ලේකම් විශ්‍රාමික මේජර් ජෙනරාල් කමල් ගුණරත්න හා ආරක්‍ෂක අමාත්‍යාංශ සේවා වනිතා සභාපතිනි චිත්‍රානි ගුණරත්න මහත්මියගේ සහභාගීත්වයෙන් ඉකුත් ඔක්තෝබර් 29 වන දින විවෘත කරන ලදී.

මෙම උත්සවය සඳහා විශේෂ ආරාධිත අමුත්තියන් ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා වනිතා ගරු සභාපතිනි මයුරි ප්‍රභාවි ඩයස්, ශ්‍රී ලංකා නාවික හමුදා සේවා වනිතා ගරු සභාපතිනි චන්දිමා උලුගේතැන්න සහ ශ්‍රී ලංකා පොලිස් සේවා වනිතා ගරු සභාපතිනි ප්‍රියංගි වික්‍රමරත්න යන මහත්මීන් ද සහභාගී වූහ.





# රණවිරු පවුල්වලට සහන...

ගෝලීය වසංගත තත්වයක් වන කොවිඩ් 19 මේ වන විට ශ්‍රී ලංකාව තුළ නැවත ව්‍යාප්තවීම හේතුවෙන් මෙරට බොහොමයක් ජනතාව ඉතා අසීරු කාලසීමාවක් පසුකරමින් සිටියි. එබැවින් යුද්ධ හමුදාධිපති තුමන්ගේ සංකල්පයකට අනුව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනියගේ සම්බන්ධීකරණයෙන් හා මගපෙන්වීම යටතේ අත්‍යාවශ්‍ය එළවළු ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 6000 ක ප්‍රමාණයක් පනාගොඩ, මැනිංටවුන්, සමිට් ෆ්ලැට් සහ ඇන්ඩර්සන් යන යුද්ධ හමුදා විවාහක නිවාසයන්හි වාසය කරනු ලබන අයවලුන්ගේ සුභසාධනය උදෙසා පසුගියදා සහනදායී මිල ගණන් යටතේ ලබාදෙන ලදී.

මෙම එළවළු ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමේ අවස්ථාව සඳහා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනිය සුජීවා නෙල්සන් මහත්මිය, ව්‍යාපෘති භාර සේවා වනිතා ජ්‍යේෂ්ඨ සාමාජිකා චාමා වනසිංහ මහත්මිය, සේවා වනිතා ඒකකයේ කර්නල් (සම්බන්ධීකරණ) ඇතුළු නිලධාරීන්, නිලධාරිනියන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.



# සෙබළුන්ගේ පරිභෝජනයට සහල් පරිත්‍යාගයක්...

යුද්ධ හමුදා කෘෂි හා පශු සම්පත් අධ්‍යක්‍ෂ මණ්ඩලය යටතේ පවත්වාගෙන යනු ලබන යුද්ධ හමුදා මූලස්ථානයේ හා කන්දකාඩු වී ගොවිපළෙහි නිෂ්පාදිත සහල් යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සංකල්පයක් මත යුද්ධ හමුදා සෙබළුන්ගේ පරිභෝජනය සඳහා ලබාදීමට කටයුතු යොදා ඇත.

ඒ අනුව සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනියගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ පවත්වාගෙන යනු ලබන ආහාර ව්‍යාපෘතීන් සහ සුහසාධක වෙළඳසැල්හි අලෙවිය සඳහා මෙම නිෂ්පාදිත සහල් කිලෝග්‍රෑම් 25,000 ක් ලබාදීමට කෘෂි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් කටයුතු යොදා ඇත. එය සංකේතවත් කරමින් සහල් කිලෝග්‍රෑම් 5,000 ක තොගයක් කෘෂි අධ්‍යක්‍ෂ බ්‍රිගේඩියර් අයිපී කන්දනආරච්චි විසින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ කර්නල් (සම්බන්ධීකරණ) කර්නල් ටීඑස් බාලසූරිය වෙත ඉකුත් ඔක්තෝබර් 09 වන දින සේවා වනිතා මධ්‍යගත සැපයුම් ව්‍යාපෘති පරිශ්‍රයේදී භාරදෙන ලදී.

මෙම අවස්ථාව සඳහා 6 වන යුද්ධ හමුදා පොදු සේවා බළකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩීඑල්සීඑන් මුත්තන්තිරිගේ ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

# සංඥා බළකා සේවා වනිතා ශාඛාව...



ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික රෝහල් සංචාරය ඉකුත් සැප්තැම්බර් 12 වන දින සිදුකෙරිණ. මෙම සංචාරය සඳහා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය රමණී දෙමටන්පිටිය මහත්මිය ඇතුළු ජ්‍යේෂ්ඨ සාමාජිකාවන් පිරිසක් එක්වූහ. එහිදී මුල්ලේරියාව මානසික රෝහලේ කාන්තා වාට්ටු අංක 05 හි සිටින රෝගීන් සඳහා තෑගි පාර්සල් සහ දිවා ආහාරයක්ද ලබාදුන් අතර, එම වාට්ටුව වෙනුවෙන් බුදු පිළිමය තැන්පත් කිරීම සඳහා දැවයෙන් නිමවන ලද ආධාරකයක් ද පරිත්‍යාග කරන ලදී.

# පාබල හමුදා සේවා වනිතා ශාඛාව...

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේජේ ජයවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් ගේ මඟපෙන්වීම යටතේ එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි අනූජා ජයවීර මහත්මියගේ උපදෙස් පරිදි 23 වන පාබල හමුදා ඒකකයට අයත් එක්දරු පියෙකු වන සෙ/326856 කෝප්‍රල් විමලවීර එම්ටීඒපී යන කොනොනි වෙත නිවසක් ඉදිකර විවෘත කිරීම ඔක්තෝබර් 17 වන දින සිදුකෙරිණ. 23 වන ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකයේ පූර්ණ අධීක්‍ෂණය සහ ශ්‍රම දායකත්වයෙන් එම නිවස ඉදිකෙරුණි.



# යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...

සේවයේ යෙදී සිටියදී 2016.08.02 වන දින රිය අනතුරකින් මියගිය 1 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවට අයත් සෙ/826501 ලා/කෝප්‍රල් කහදවල එස්ජී කොනොනිගේ ළඟම ඥාතීන් වෙනුවෙන් ඉදිකරන ලද නව නිවසක් ඉකුත් සැප්තැම්බර් 13 වන දින යාන්ත්‍රික පාබල රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒජීඩීඑන් ජයසුන්දර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි ජයසුන්දර මහත්මියගේ සුරතින් අදාළ කොනොනිගේ බිරිඳ හා පුතණුවන් වෙත ලබාදෙන ලදී. යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සම්බන්ධීකරණයෙන් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ මුදල් ප්‍රතිපාදන මත 1 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ ශ්‍රම දායකත්වයෙන් එම නිවස ඉදිකෙරිණ.



# සන්නද්ධ බුද්ධි බළකා සේවා වනිතා ශාඛාව...

සන්නද්ධ බුද්ධි බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය අසංකා හේවාවිතාරණ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ඔක්තෝබර් 03 වන දින එම සේවා වනිතා ශාඛාවේ මහ සභා රැස්වීම පැවැත්විණි. එහිදී ආරාධිත දේශක වසන්ති රාජපක්‍ෂ මහත්මිය විසින් මනෝවිද්‍යාත්මක දේශනයක් පැවැත්වූ අතර, සේවා වනිතා සාමාජිකාවන් විශාල පිරිසක් එදින එම වැඩසටහන සඳහා සහභාගී වූහ.



# ඉංජිනේරු සේවා බළකා සේවා වනිතා ශාඛාව...



ඉංජිනේරු සේවා බලකායට අයත් යුද්ධ හමුදා සෙබළුන්ගේ දූ දරුවන් අතුරින් 2019 වර්ෂයේ අපොස (සා/පෙළ) විභාගයෙන් "ඒ" සාමාර්ථ 09 ක් ලබාගෙන විශිෂ්ට ලෙස සමත්වූ දූ දරුවන් 09 දෙනෙකු වෙත එම සේවා බලකා සේවා වනිතා ශාඛාව වෙතින් ටැබ් පරිගණක පිරිනමන ලදී. ඉකුත් ඔක්තෝබර් 12 වන දින ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි වෛද්‍ය නිරෝෂණී ගනේගොඩ මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම මාහැඟි කටයුත්ත සිදුකෙරිණ.

# වෛද්‍ය බළකා සේවා වනිතා ශාඛාව..



වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනියගේ සංකල්පයක් මත එම බලකා සාමාජිකයින් හට ඉංග්‍රීසි කථා කිරීමේ පුහුණු වැඩමුළුවක් ඉකුත් සැප්තැම්බර් 16 වන දින සිට එය ආරම්භ කරන ලදී. මෙම වැඩමුළුව *TOAST MASTERS INTERNATIONAL* ආයතනය වෙතින් පවත්වනු ලබන අතර, ඉකුත් සැප්තැම්බර් 16 වන දින සිට සෑම බදාදා දිනයක්ම ආවරණය වන පරිදි සිදුකරනු ලබයි. ඒ අනුව මෙම වැඩමුළුවේ පළමු අදියර යටතේ වෛද්‍ය බලකා සාමාජිකයින් 20 දෙනෙකු සහභාගී වූහ.

# පොදු සේවා බළකා සේවා වනිතා ශාඛාව...



කොල්ලුපිටිය, ශාන්ත මයිකල් විද්‍යාලයේ ඉගෙනුම ලබන අඩු ආදායම්ලාභී පවුල්වල දරිද්‍රතාවයෙන් පීඩිතව දරුවන් වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ සේවා වනිතා ගරු සභාපතිනි දීපා හඳුන්මුල්ල මහත්මියගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් මාලාවක් පැවැත්විණ. මෙම වැඩසටහන් කොළඹ සෙන්ටේනියල් සිංහ සමාජයේ පූර්ණ දායකත්වයෙන් යුතුව 1 වන පොදු සේවා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් සීඑස් දේමුණි ගේ අධීක්ෂණය යටතේ එම ඒකකයේ නිලයින් විසින් සංවිධානය කරනු ලැබූහ. පාසල් දරුවන් හට පාසල් උපකරණ ලබාදීම, ඔවුන්ගේ දෙමාපියන් හට වියළි සළාක මල්ලක් බැගින් පරිත්‍යාග කිරීම, දරුවන්ගේ ඇස් පරීක්ෂාවට ලක්කිරීම, ළමා පිළිකා හා දියවැඩියා රෝග පාලනය පිළිබඳ දේශන ඇතුළු වැඩසටහන් රැසක් එදින පැවැත්විණ.



# තුරුලිය රැකුමට මුල්වෙමින්...

ඉකුත් ඔක්තෝබර් 10 වන දිනට යෙදුණු අභිමානවත් 71 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව ආරක්‍ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑච්ඒ සෙනරත් බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ගේ උපදෙස් හා මගපෙන්වීම මත පලාලි යුද්ධ හමුදා ජනපදයේ පැළ 200 ක් රෝපණය කිරීම පසුගිය ඔක්තෝබර් 04 වන දින සිදුවිය.



# පින් බිමක සංචාරයක්...

ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සිය රාජකාරී භාරගැනීමෙන් අනතුරුව අනුරාධපුර පුදබිමේ ආගමික සිද්ධස්ථාන වැඳපුදා ගැනීමට එක්විය. ඉකුත් ඔක්තෝබර් 27 වන දින සිදුකරන ලද එම සංචාරයේදී අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය, රුවන්වැලිසෑය, මිරිසවැටිය, අභයගිරිය, ථූපාරාමය, ලංකාරාමය හා ඉසුරුමුණිය යන ආගමික ස්ථාන වැඳපුදා ගැනීමෙන් අනතුරුව හෙතෙම මහා සංඝයා වහන්සේලාගේ ආශිර්වාද ලබාගන්නා ලදී. මේ අවස්ථාව සඳහා 21 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඇතුළු නිලධාරීහු රැසක්ද සහභාගී වූහ.



# සුහද හමුවක මතක සටහන්...

ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කපිතාන් විකාස් සූඩ් ඉකුත් ඔක්තෝබර් 20 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) සංචාරයක නිරත වූ අතර, එහිදී නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජේසී ගමගේ එන්ඩීසී පීඑස්සී හමුවී සුහද පිළිසඳරක නිරතවිය. මෙම හමුවේදී ද්විපාර්ශ්වික සහ අන්‍යෝන්‍ය සහයෝගීතාවය සබැඳි කරුණු පිළිබඳ අදහස් හුවමාරු කරගත් අතර, හමුව අවසානයේ සංකේතාත්මක සමරු තිළිණ හුවමාරුවක් ද සිදුකෙරිණ.






# එක්ව සුරකිමු "නැගෙනහිර"

නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානය විසින් දියත් කරනු ලබන "එක්ව සුරකිමු නැගෙනහිර" සහ "එක්ව සුරකිමු පොළොන්නරුව" යන පරිසර සංරක්ෂණ ව්‍යාපෘතීන් යටතේ සමාජ සේවා සංවිධානයන්හි සහයෝගය මත නැගෙනහිර පළාතේ සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලු ජනවර්ගවලට අයත් ස්වේච්ඡා සේවකයින්ගේ සහභාගීත්වයෙන් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 04 වන දින දියත් කෙරිණ. ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ජේසී ගමගේ එන්ඩීසී පීඑස්සී ගේ සංකල්පයකට අනුව පරිසරය සංරක්ෂණය කිරීමේ ජාතික වැදගත්කම සහ පරිසරය පිරිසිදුව තබාගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් යුද්ධ හමුදාවේ මූලිකත්වයෙන් සංවිධානය කරනු ලැබූ මෙම ප්‍රජා ව්‍යාපෘතිය ත්‍රිකුණාමලයේ සිට හබරණ දක්වා දිවෙන දැවැන්ත වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කරන ලදී.

මෙම අවස්ථාවට බෞද්ධ භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ ආගමික නායකයින්, නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති, 22, 23 සහ 24 වන සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති, රාජ්‍ය නිලධාරීන්, සිවිල් සංවිධාන ප්‍රධානීන්, විදුහල්පතිවරු, දෙමව්පියන්, පාසල් සිසු සිසුවියන් ඇතුළු මහජනතාව සක්‍රීය ලෙස දායක වෙමින් ඒ වෙනුවෙන් සිය ශ්‍රම දායකත්වය ලබාදුන්හ.





# හිසට සෙවණක්...

ආරක්ෂක සේනා (කිලිනොච්චි) ආඥාපති මේජර් ජෙනරාල් කේඑන්එස් කොටුවේගොඩ එන්ඩීසී අයිජී ගේ මගපෙන්වීමෙන් එම ප්‍රදේශයේ පදිංචි අඩුආදායම්ලාභී පවුල් දෙකක් වෙත නව නිවාස දෙකක් ඉදිකර පරිත්‍යාග කරන ලදී. 9 වන හා 20(සේව) විජයබාහු පාබල රෙජිමේන්තු භටපිරිස් විසින් ඒ සඳහා ශ්‍රම දායකත්වය ලබාදුන්හ.

57 වන සහ 65 වන සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු මෙන්ම ඒකක අණදෙන නිලධාරීන්ගේද අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ ඉදිවූ මෙම නිවාස වෙත මොහාන් ශංකර් මහතා සහ එම මැතිණිය එක් නිවසකට මිලියනය බැගින් වූ මූල්‍ය ආධාර ලබාදී ඇති අතර, 9 වන විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් නිවසට අවශ්‍ය ගෘහ භාණ්ඩ පරිත්‍යාග කරන ලදී.



# නිවාස සිහිනය සැබෑ කරමින්...

නැගෙනහිර වෙම්මලෙයි, නයාරු යන ලිපිනයෙහි පදිංචි අඩුආදායම්ලාභී පවුලක් වන ඥාණ ප්‍රකාශම් මරියදාසන් යන අය වෙනුවෙන් 59 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ ඉදිවූ නව නිවසක් ඉකුත් සැප්තැම්බර් 28 වන දින සුභ මොහොතින් පරිත්‍යාග කෙරිණ. එම ප්‍රජා සත්කාරය සඳහා මොහාන් ශංකර් මහතා සහ එම මහත්මිය විසින් මූල්‍ය අනුග්‍රහය ලබාදී ඇති අතර, 59 වන සේනාංකය වෙතින් ඊට රුපියල් 120,000 ක් වටිනා ගෘහ භාණ්ඩ පිරිනමන ලදී. එම අවස්ථාව සඳහා ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ආර්එම්පීජේ රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් හා අදාළ පරිත්‍යාගශීලීන් සහභාගී වූහ.




# අභිනවයෙන් ඉදිකළ ජන අවන්හල විවෘත කෙරේ...

8 වන ගැමුණු හේවා බළඇණියේ හටපිරිස් විසින් ඉදිකරන ලද ජන අවන්හලක් ඉකුත් ඔක්තෝබර් 23 දින කුරුවිට ගැමුණු හේවා බළකා රෙජිමේන්තු මූලස්ථානයේ දී සියලු නිලයින් වෙනුවෙන් විවෘත කෙරිණ. යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සුභසාධන පහසුකම් තවදුරටත් නංවාලීමේ අරමුණින් 8 වන ගැමුණු හේවා බළඇණියේ අණදෙන නිලධාරී ගේ උපදෙස් මත මෙම කාලෝචිත අවශ්‍යතාවය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් එම බළඇණියේ සියලු නිලයින්ගේ සහයෝගය ලැබිණ.

මෙම ජන අවන්හල විවෘත කිරීමේ අවස්ථාවට ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මෙන්ම ගැමුණු හේවා බළකායේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් බීවීඩීපී අබේනායක යූඑස්පී එන්ඩීයූ සහභාගී විය.



# "ටැක්ග් බෝල්" ක්‍රීඩාව හඳුන්වා දෙමින්...

ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් පරිදි බණ්ඩාරවෙල, දියතලාව, හපුතලේ, වැලිමඩ ආශ්‍රිත ප්‍රදේශයන්හි පාපන්දු ක්‍රීඩාවේ නිරතවන ක්‍රීඩා සමාජ වෙත "ටැක්ග් බෝල්" ක්‍රීඩාව හඳුන්වාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 03 වන දින බණ්ඩාරවෙල ශාන්ත ජෝශප් ජාතික පාසලේ ක්‍රීඩා පිටියේදී පවත්වන ලදී. එහිදී ටැක්ග් බෝල් ක්‍රීඩාව පිළිබඳ ක්‍රීඩකයින්ට කෙටි පුහුණුවක්ද ලබාදුන් අතර, එම අවස්ථාවට එක්වූ ආඥාපති තුමන්ගේ සුරතින් ක්‍රීඩා උපකරණ බෙදාදීමක්ද සිදුවිය.



# බීජ හා කෘෂි පරිත්‍යාගයක්...

යුද්ධ හමුදාධිපති තුමන්ගේ උපදෙස් පරිදි ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී ගේ මඟපෙන්වීමෙන් මධ්‍යම බලප්‍රදේශයේ පිහිටා ඇති දුෂ්කර ගම්මාන කිහිපයක ගොවීන් පිරිසක් වෙත "තුරු මිතුරු නව රටක්" සංකල්පය යටතේ බීජ හා කෘෂි උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 18 වන දින දියත් කරන ලදී.

# රණඝෂිතයට පත් විරුවන් හමුවෙයි...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා 71 වන සංවත්සර දිනයට සමගාමීව රණඝෂිතයට පත් වූ රණවිරුවන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් ඉකුත් සැප්තැම්බර් 30 වන දින රණවිරු සෙවණ, අභිමංසල 1, 2, 3 සහ මිහිඳු සෙත් මැඳුර යන සුවසහන නිකේතනයන්හි හි සංචාරයක් සිදුකරනු ලැබූහ. එහි විශේෂ අවස්ථා පහත දැක්වේ.



මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීඑස් වනසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ඇතුළු නිලධාරීන් පිරිස අභිමංසල 1 සුවසහන නිකේතනයේ රණඝෂිතයට පත් විරුවන්ගේ සුවදුක් සොයා බැලූ අවස්ථාව...



මේජර් ජෙනරාල් එච්එම්වීබී හංගිලිපොල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු නිලධාරීන් පිරිස රණවිරු සෙවණ සුවසහන නිකේතනයේ රණඝෂිතයට පත් විරුවන්ගේ සුවදුක් සොයාබලමින්...



මේජර් ජෙනරාල් අයිඑච්එම්එන්එන් හේරත් ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඇතුළු නිලධාරීන් පිරිස අභිමංසල 3 සුවසහන නිකේතනයේ සිදුකරනු ලැබූ සංචාරයේ මතක සටහන්...



මේජර් ජෙනරාල් සීයූ මාරසිංහ ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් පිරිස රණවිරු සෙවණ සුවසහන නිකේතනයේ සිදුකළ සංචාරය අතරතුර...



# අපි කථා කරන්නේ කොහොමද?

පුංචි ළදරුවකු මෙලොව එළිය දුටු පළමු මොහොතේම කරන පළමු කාර්ය වන්නේ කෑ ගසා හැඬීමය. එය ඔවුන් ඔවුන්ගේ හඬ භාවිතා කරන පළමු මොහොතය. සමහර ළදරුවන් ඉතා මෘදු හඬින් හඬන අතර සමහර ළදරුවන් හඬන්නේ ඉතා උස් හඬිනි. එහෙත්, උපත ලද පළමු මොහොතේම ළදරුවන්ට කථා කල නොහැක.

කාලයත් සමඟ ළදරුවා තමා අවට පරිසරයේ මිනිසුන්ගේ කථාවන්ට අවධානය දීමට පෙළඹෙයි.  ඒ තම දෙමාපියන් සහෝදර සහෝදරියන් නෑදෑ හිතවතුන් හෝ විද්‍යුත් රූප මාධ්‍ය තුළින් විය හැක. ඇහුම්කන්දීමත් සමගම දරුවා මුඛය ආශ්‍රයෙන් ශබ්ද නිපදවීමට උත්සාහ දරයි. එම ශබ්ද වලට තේරුමක් දීමට නොහැක. නමුත් එයට තාලයක් සහ රිද්මයක් ඇත.

උදා :-   ප----ප----ප----ප

බ----බ----බ----බ

එතුළින් ළදරුවා ස්වයං උත්තේජනයක් ලබන අතර, ඉන් මහත් වූ විනෝදයක්ද ලබයි. ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වන ළදරුවා ශබ්ද වචන හැසිරවීමට උත්සාහ දරයි.  එනම් ශබ්ද කිපයක් එකතු කරමින් වචන සෑදීමට උත්සාහ දරයි.

උදා :-   අ...ම්...මා

තා...ත්...තා

බෝ...

මෙම වචන වලට තේරුමක් ද ඇත. ළදරුවා දිගින් දිගටම භාෂා අත්හදා බැලීම්වලට පෙළඹෙමින් වචන ඉගෙන ගන්නා අතර, ඉන් මහත් වූ තෘප්තියක් ලබයි. ළදරුවා පිට කරන මෙම වචන අවට පරිසරයේ පුද්ගලයින් තේරුම් ගන්නට හුරුවේ. එසේම එම වචනයන්ට ප්‍රතිචාර දැක්වීමටද නිරායාසයෙන්ම පෙළඹේ.

මෙම ක්‍රියාවලියත් සමගම ළදරුවාගේ මොළයත් භාෂණය සහ ශ්‍රවණයට අදාළ සියලුම ඉන්ද්‍රියයන් උත්තේජනය වීමට පටන් ගනී. එහිදී ස්නායු පද්ධතිය මගින් කටහඬ පිටවීමට අදාළ පණිවිඩ මොළයේ සිට කථන ඉන්ද්‍රියයන් වෙතත් අනෙක් පුද්ගලයින්ගේ කටහඬ තේරුම් ගැනීමට අදාළ පණිවිඩ ශ්‍රවණ ඉන්ද්‍රියයන්ගේ සිට මොළයටත් රැගෙන යයි.

කණ්නාඩියක් ඉදිරිපිටට ගොස් කථාකර බැලූ විට ඔබට මෙය පැහැදිලි වේවි. ඔබ කථාකරන විට ඔබගේ කථන ඉන්ද්‍රියයන් හා උගුර අවට චලනය වන ආකාරය ඔබට පෙනේවි. ඔබේ බෙල්ලට අත තබා බලන්න. එවිට ඔබට දැනේවි ඔබ කථා කරන විට ඔබේ ස්වර තන්ත්‍රි කම්පනය වන ආකාරය.

ඔබ හුස්ම ගන්නා විට ඔබේ පෙණහලු හුස්ම වලින් පිරේ. ඔබ හුස්ම හෙලන විට පෙණහලු තුළින් නැවත හුස්ම ස්වර තන්ත්‍රි කම්පනය කරමින් ඒ හරහා මුඛය වෙත පැමිණෙන අතර, එම වාතය උපයෝගී කර ගනිමින් ඔබේ කථන ඉන්ද්‍රියයන් චලනය වෙමින් ඔබේ කටහඬ පිටවේ.

පහත ක්‍රියාකාරකම් අත්හදා බැලීමට උත්සාහ කරන්න. පහත සරල ක්‍රියාකාරකම් අත්හදා බලන්න. එවිට මෙම සංකීර්ණ ක්‍රියාවලිය පිළිබඳ යම් අවබෝධයක් ඔබට ලබාගත හැක.

1. හොඳින් හුස්ම ගන්න. එම හුස්ම ගන්න අතරතුර ඔබේ නම පැවසීමට උත්සාහ කරන්න.

2. හොඳින් හුස්මක් ගන්න. එම හුස්ම පිටකරමින් ඔබේ නම පවසන්න.

3. ඔබ ගත් හුස්ම වරින් වර නවත්වමින් ඔබේ නම පැවසීමට උත්සාහ කරන්න.


දැන් කථාව පිට කිරීමට සුදුසු යැයි ඔබට හැඟෙන හොඳම ක්‍රමය කුමක්දැයි ඔබම තීරණය කරන්න.

ඔබ ඔබේ හුස්ම නවත්වාගෙන කථා කිරීමට උත්සාහ කරන විට ඔබගේ සමහර කථන ඉන්ද්‍රියයන් චලනය වනවා මිස ඔබට ශබ්දය පිටවන සේ කථා කළ නොහැක.

ඔබ හුස්ම ගන්නා අතරතුර කථා කිරීමට උත්සාහ කරන විට ඔබේ කටහඬේ විහිලු ස්වරූපයක් ගන්නා බව ඔබට තේරෙන්නට ඇත.

නමුත් ඔබ ගත් හුස්ම පිටකරන අතරතුර කථාකරන විට ඔබට ඉතා පහසුවෙන් හා හොඳින් කථා කළ හැක.

ස්වාසනාලයේ ඉහළම කොටසේ ඔබේ කථා පෙට්ටිය එහෙමත් නැත්නම් ස්වර තන්ත්‍ර පිහිටා ඇත. මෙම ස්වර තන්ත්‍ර දෙක මැදින් සිදුරක් පිහිටා ඇත. ඔබ කථා නොකරන විට මෙම සිදුර විවෘතව පවතින අතර, ඔබ ඉහළට ගත් හුස්ම කිසිදු ශබ්දයකින් තොරව එම සිදුරු තුළින් නැවත එළියට ගමන් කරයි. මෙම සිදුර දෙපැත්තෙන් එකිනෙක වදින පටි දෙකක් පිහිටා ඇත. එම පටි ස්වර තන්ත්‍ර නම් වේ. ඒවා හරියට විශේෂ හමකින් වට




වූ ඝනකම"රබර් බෑන්ඩ්" දෙකක් වැනිය. ඔබ කථා කරන විට ස්වර තන්ත්‍ර එකිනෙක ගැටෙන්නේ ඒ අතරමැද ඇති සිදුර කුඩා කරමිනි.

පෙණහලු වල පිරී තිබූ වාතය ඉහළට තල්ලු වන්නේ මේ කුඩා වූ සිදුර තුළිනි. එම වාතය ඉහළට තල්ලු වන්නේ ඔබේ ස්වර තන්ත්‍ර වලට එරෙහිව බලයක් යොදමිනි. එමගින් ස්වර තන්ත්‍ර කම්පනය වීමට පටන් ගනී. එම ස්වර තන්ත්‍ර ඉතාමත් වේගයෙන් සෙළවෙන අතර, ඉන් ඔබේ හඬ පිට වේ.

හිස් යෝගට් කෝප්පයක් ගන්න. එයට රබර් බෑන්ඩ් 02 ක් දමන්න. ඔබේ ඇඟිල්ලක් ආධාරයෙන් එය සෙමින් සොලවන්න. ඒ දෙස හොඳින් බලන්න. ඉන් එන ශබ්දයට හොඳින් ඇහුම්කන් දෙන්න. රබර් පටි දෙක ඉතා වේගයෙන් කම්පනය වන ආකාරය ඔබට දකින්නට ලැබේවි. එම කම්පනයත් සමග හඬක් පිට වේ. ඔබ පිට කරන හුස්ම ඔබේ ස්වර තන්ත්‍ර හරහා ආපසු ගමන් කරමින් ඒවා කම්පනය කරමින් ඔබේ කටහඬ නිපදවන්නෙත් මේ ආකාරයෙනි.

බැලූමක් ගෙන එයට තරමක් හුළං පුම්බන්න. එය විවරය අසලින් වාතය එළියට නොයෙන සේ තද කර අල්ලා ගන්න. ඉන්පසු එකපාරටම විවරය අසලින් වාතය එළියට නොයෙන සේ තද කර අල්ලා ගත් ඇඟිලි දෙක වාතය පිටවන සේ අතහරින්න.

නැවතත් බැලූමක් ගෙන හොඳින් හුළං පුම්බන්න. පෙර ලෙසම වාතය එළියට නොයෙන සේ විවරය අසලින් තදකර අල්ලා ගන්න. එක පාරටම වාතය පිටවන ලෙසින් විවරය ලිහිල් කරන්න. අවධානයෙන් සිටින්න. ඔබට ඇසෙන්නේ කුමක්ද? ඔබට දැනෙන්නේ කුමක්ද? බැලූම තුළින් පිටවන වාතය මගින් බැලූමේ විවරය කම්පනය වන ආකාරය ඔබට පෙනෙනු සහ දැනෙනු ඇත. එසේම එම පිටවන වාතය මගින් ශබ්දයක් නිපදවන ආකාරයද ඔබට අසන්නට පුළුවන. විශාල වාතය ප්‍රමාණයක් පිටවන විට විශාල ශබ්දයක්ද කුඩා වාතය ප්‍රමාණයක් පිටවන විට කුඩා ශබ්දයක්ද නිකුත්වන ආකාරය ඔබට අසන්නට හා දකින්නට හැකිය.

එලෙසින්ම ඔබ ශබ්ද නගා කථාකරන විට විශාල වාතය ප්‍රමාණයක් ඔබේ ස්වර තන්ත්‍ර කම්පනය කරමින් ඊට එරෙහිව ගමන් කරයි.

පහත ක්‍රියාකාරකම් කරමින් විනෝදයක් ලබන්න.

1. එක හුස්ම වාරයක් තුළ ඔබට කී වරක් ඔබේ නම කියා කෑ ගැසිය හැකිද?

2. එක හුස්ම වාරයක් තුළ කී වරක් ඔබට ඔබේ නම ශබ්ද නොහැඟෙන ලෙස කිව හැකිද?

මෙහිදී ශබ්ද නොහැඟෙන ලෙස කථා කිරීමට වඩා ශබ්ද නගා කථා කිරීමට විශාල වාතය ප්‍රමාණයක් වැය වෙන ආකාරය ඔබට අත්දකින්නට ලැබේවි.

ගීතයක් ගායනා කරන්න. එම ගීතයේ ඔබ උච්චාරණය කරන උච්ච ලෙස ඇසෙන ශබ්දයන්ටත් මඳ ලෙස ඇසෙන ශබ්දයන්ටත් හොඳින් අවධානය දෙන්න. ඔබගේ ස්වර තන්ත්‍ර අවට ඇති මාංශ පේශීන් ඔබ උච්ච ශබ්ද පිට කරන විට දැඩි පීඩනයක් යොදමින් තද කරන අතර, මඳ ශබ්ද පිට කරන විට එම මාංශ පේශීන් ලිහිල් කරයි.

නැවතත් කෝප්පයක් ගන්න. ඉලාස්ටික් පටියක් ගෙන ප්ලාස්ටික් කෝප්පය වටේ ඔතන්න. කෝප්පය කෙළවරකින් ඉලාස්ටික් පටිය ඇද එය යම් රඳවනයකට හිර කරන්න (දොර හැඬලයක්). දැන් ප්ලාස්ටික් කෝප්පය විරුද්ධ පැත්තට අදින්න. එවිට ඉලාස්ටික් පටිය තද ගතියක් දැනේ. ඇඟිල්ලෙන් ඉලාස්ටික් පටියට තට්ටුවක් දමන්න. ඇසෙන ශබ්දයට සවන් දෙන්න. ඉලාස්ටික් පටිය ඇදීම වැඩිවෙන විට ශබ්දය උච්ච ශබ්දයක් බව ඔබට වැටහේවි.

ස්වර තන්ත්‍ර මගින් නිපදවන ශබ්දයන් ඔබේ මුඛය තුළ ඇති උච්චාරණ ඉන්ද්‍රියයන් ආධාරයෙන් ඇසෙන ශබ්ද බවට පෙරළන අතර, ක්‍රමයෙන් ඒවා අක්ෂර ශබ්ද හා වචන බවට පෙරළිය හැකිය.

දැන් කණ්නාඩියක් ඉදිරියට ගොස් ඔබේ නම කියන්න. දැන්

ඔබේ උච්චාරණ ඉන්ද්‍රියයන් ශබ්දයට අනුකූලව වෙනස්වන අයුරු ඔබටම දකින්නට ලැබේවි. ඔබ කථා කරන විට ඔබේ තොල් උඩට පහළට මෙන්ම මුඛය ඇරෙනවා වැහෙනවාත් ඔබට දක්නට ලැබේවි. ඔබේ හනුව දෙපැත්තට මෙන්ම උඩට සහ පහළටත් ගමන් කරනු ඔබට පෙනේවි. ඔබේ දිව සතර දිශාවටම ගමන් කරනු ඔබට දැනේවි. මෙම උච්චාරණ ඉන්ද්‍රියයන් එකිනෙක වෙනස් වූ ශබ්ද පිටකිරීම සඳහා එකිනෙකට වෙනස් වූ චලනයන් භාවිතා කරනු ඔබට පෙනේවි. ඔබගේ ශබ්ද කිරීම අතරතුර ඔබේ තොල් චලනය වන ආකාරය අනුව ඔබ නිපදවන ශබ්දයද වෙනස් වේ.

උදා :- ආ උ ඒ ඔ ර්

සමහර වේලාවට ඔබ ඔබේ තොල් වසමින් එක පාරටම හුස්ම පිට කරමින් ශබ්ද නිපදවන බව ඔබ නොදන්නවා විය හැකිය. එවන් ශබ්ද ලෙස ප බ ම හැඳින්විය හැක. ඔබේ අත මුව ඉදිරියෙන් තබාගන්න. මෙම ශබ්ද නිපදවා බලන්න. එවිට එක්වරම එම ශබ්ද නිපදනවාත් සමගම කටින් හුස්ම පිටවනවා ඔබට දැනෙනු ඇත. මෙසේ ඔබට කැමති ලෙස විවිධ ශබ්ද නිපදවා බලන්න.

අප කතා කරන විට විවිධාකාර ශබ්ද නිපදවීමට ඔබේ මුඛය සහ ඒ ආශ්‍රිත කථන ඉන්ද්‍රියයන් ඉතා ඉක්මණින් චලනය වෙමින් ඊළග ශබ්දය නිපදවීම සඳහා සූදානම් විය යුතුය.

අවු 18 ට වැඩි වයසක් ගන්නා වැඩිහිටි පිරිමින්ට කාන්තාවන්ට දරුවන්ට වඩා විශාල ස්වර තන්ත්‍ර පිහිටා ඇත. ඒ නිසාම ඔවුන්ගේ කටහඬ වඩා රළු ස්වභාවයක් ගනී. සාමාන්‍යයෙන් පිරිමි දරුවෙකු අවුරුදු 13 පමණ වන විට ඔවුන්ගේ කටහඬ රළු කටහඬක් බවට වෙනස් වීමට පටන් ගනී. අප එකිනෙකාගේ මුඛය තුළ වූ ඉඩ ප්‍රමාණයන්, නාස් කුහරයන්හි ප්‍රමාණයන්, උගුරේ සහ ස්වර තන්ත්‍රයන් හි ප්‍රමාණයන් එකිනෙකට වෙනස් වේ. ඒ නිසා අප සැමගේම කටහඬවල් හා අප නිපදවන ශබ්දයන් එකිනෙකට වෙනස් වේ.

ඔබගේ යහළුවන් කිහිප දෙනෙකුට ඔබගේ කාමරයට කථා කරන්න. ඔවුන්ට ඔබේ නම ශබ්ද නගා කියන්න යැයි පවසන්න. ඔබ ඔවුන්ගේ මූණ නොපෙනෙන සේ ඇස් දෙක වසාගන්න. ඔවුන්ගේ කටහඬ පමණක් අසා මුහුණු නොදැක ඔවුන් කී දෙනක් ඔබට කටහඬින් හඳුනාගැනීමට පුළුවන් දැයි බලන්න.

*ලුතිනන් ඒඑම් මේනකා අධිකාරි*
*2 ශ්‍රීලංකාහෝදසේබ*
*විශේෂ විද්‍යාවේදී කථන හා භාෂා චිකිත්සක*
*වාග්විද්‍යා ශාස්ත්‍රපති*
*ජාතික ඩිප්ලෝමාධාරී මනෝ උපදේශක*
*රණවිරු සෙවණ - රාගම*







# සංවත්සර දිනය සමරමින්...

56 වන පාබල සේනාංකය ස්ථාපිත කර වසර 23 ක් සපිරීම නිමිත්තෙන් එම සේනාංක ධජයන්ට සෙත් පැතීම සඳහා ඉස්ලාම්, හින්දු හා කතෝලික ආගමික ආශිර්වාද ලබාගැනීම පසුගියදා සිදුකෙරිණ. එම ධජයන්ට සෙත් පැතීමේ අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඩබ්ලිව්ආර් ද ආබෲ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහභාගී වූ අතර, එම සේනාංකය යටතේ පාලනය වන 561, 562 හා 563 වන බලසේනාවන්හි බලසේනාධිපතිවරු ද, අනෙකුත් නිලධාරීන් හා සෙසුනිලයින් විශාල පිරිසක් ද ඊට එක්වූහ.





# පාලන පරීක්‍ෂාවක්...

ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ආඥාපති හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ආර්එල්සී ප්‍රනාන්දු ඒඒටීඕ ඉකුත් සැප්තැම්බර් 02 වන දින 4(සේවා) යුද්ධ හමුදා යුධෝපකරණ බලකායෙහි නිරීක්‍ෂණ චාරිකාවක නිරතවිය. එම ඒකකයේ පාලන කටයුතු කාර්යක්‍ෂම හා උසස් අන්දමින් පවත්වාගෙන යෑම උදෙසා අවැසි උපදෙස් හා පහසුකම් සැලසීම එම පාලන පරීක්‍ෂාවේ අරමුණ විය.





# ප්‍රජාසත්කාරයක්...

71 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපති ගේ අදහසකට අනුව 52 වන සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේ ලියනගේ ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පුත්තූර් ශාන්ත ලූකස් වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් වෙත දිවා ආහාරය ලබාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 05 වන දින පවත්වන ලදී. 521 බලසේනාව මෙම මාහැඟි කටයුත්ත සංවිධානය කොට තිබුණි.

# ලෝක ළමා දිනය සමරමින්...



563 වන බලසේනා මූලස්ථානය යටතේ පාලනය වන 7 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු නිලධාරීන් සහ සෙසුනිලයින් සිය ධන පරිත්‍යාගයෙන් එම ඒකක බලප්‍රදේශයට අයත් බෝගස්වැව 2 ගම්මානයේ තෝරාගත් දිළිඳු පවුල් 5 කට අයත් දරුවන් 12 දෙනෙකු වෙත පාසල් උපකරණ බෙදාදීමේ කටයුත්තක් ඉකුත් ඔක්තෝබර් 02 වන දින සිදුකරනු ලැබුහ. එම අවස්ථාවට බෝගස්වැව විදුහලේ විදුහල්පත, 563 බලසේනා මූලස්ථානයේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී, 7 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් සහභාගී වූහ.

# දිළිඳු ජනයාට අතහිත...



56 වන සේනාංකයේ සේනාංකාධිපති ගේ මඟපෙන්වීම යටතේ 561 වන බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්එම්පීඑස්බී රත්නායක ගේ අධීක්ෂණයෙන් එම ප්‍රදේශයේ වූ පෙරියකුලම්, මාන්කුලම් හා කොල්ලයාර් පුලියන්කුලම් යන ගම්මානවල තෝරාගත් අඩුආදායම්ලාභී පවුල් සඳහා රුපියල් 2500 ක වටිනාකමකින් යුත් වියළි සලාක පාර්සල් බෙදාදීමේ මානුෂීය සත්කාරයක් ඉකුත් සැප්තැම්බර් 30 වන දින සිදුකරන ලදී. මෙම කටයුත්ත සඳහා දෙහිවල පිහිටි පද්මහංස ප්‍රජා සේවා ව්‍යාපෘතියේ අධ්‍යක්ෂිකා ඇතුළු කාර්ය මණ්ඩලයේ දායකත්වය හිමිවූහ.

# තල් බීජ බෙදාදීමේ වැඩසටහනක්...



66 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ උපදෙස් අනුව 662 බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් සීආර් පතිරවිතාන පීඑස්සී ගේ මඟපෙන්වීම මත 20 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ ඒකක අණදෙන නිලධාරී ගේ අධීක්ෂණයෙන් යුතුව එම ඒකකයේ නිලධාරීන් සහ සෙසුනිලයින් විසින් සංවිධානය කරන ලද අඩු ආදායම්ලාභී පවුල් සඳහා තල් බීජ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 25 වන දින මොක්කම්පන් 20 වන පාබල හමුදා ඒකකයේදී සිදුකරන ලදී.

# සංවත්සර දිනය සමරා...

663 වන බලසේනා මූලස්ථානය ආරම්භ කර වසර 10 ක් සපිරීම නිමිති කොටගෙන ඉකුත් ඔක්තෝබර් මස 02 වන දින ජයපුරම් හි පිහිටි එම බලසේනා මූලස්ථානයේදී ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කෙරුණේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑල්එස්එස් ලියනගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙනි. එහිදී බලසේනාධිපති වෙනුවෙන් පැවති සම්මාන මුරයේ අවස්ථාවක් ඡායාරූපයේ දැක්වේ.



# අභිමානවත් දිනයක මතක සටහන්...

541 වන බලසේනා මූලස්ථානය ස්ථාපිත කර වසර 10 ක් සපිරීම නිමිත්තෙන් ඉකුත් සැප්තැම්බර් 25 වන දිනට යෙදුණු සංවත්සර දිනය කල්අඩි කඳවුරේ දී උත්සවාකාරයෙන් සැමරිණ. එහිදී බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී පීඑස්සී හට කඳවුරු මුරයක් පිළිගැන්වීම, සියලු හට පිරිස් ඇමතීම සහ සියලු නිල තේ පැන් සංග්‍රහය එහි පැවති වැඩසටහන් අතර ප්‍රධාන විය.



# රන් අස්වනු නෙලීමේ මංගල්‍යයක්...

කුට්ටිගල පිහිටි 1 වන යුද්ධ හමුදා පොදු සේවා බලකා අනුබණ්ඩයේ රන් අස්වනු නෙලීමේ මංගල්‍යය පසුගියදා එහි නිලධාරී අණදෙන කපිතාන් බීඑස්එස්සී වීරකෝන් ගේ සංවිධායකත්වයෙන් උත්සවාකාරයෙන් සිදුකෙරිණ. පදලංගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මහවැලි සංවර්ධන අධිකාරිය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ගොවි සමිති සමගින් එම ප්‍රදේශයේ පාසල් දරුදැරියන්ගේ සහභාගීත්වයෙන් යුතුව පැවති එම රන් අස්වනු නෙලීමේ මංගල්‍යය හෙළ සිරිත් විරිත්වලට මුල්තැන දෙමින් 1 වන යුද්ධ හමුදා පොදු සේවා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් සීඑස් දේමුණි ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.



# "පුහුණුව තුළින් ප්‍රවීණත්වය"

## පාබල පුහුණු මධ්‍යස්ථානය - මින්නේරිය



**සේනාවිධායක**
*බ්‍රිගේඩියර් ඩීආර්ආර්පී ජයවර්ධන*
*ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී*



**පුහුණු අංශ අණදෙන නිලධාරී**
*කර්නල් එන්එස්එස් ඩයස් ආර්එස්පී*

1984 අගෝස්තු 25 වන දින එවකට ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති මේජර් ජෙනරාල් ටීඅයි වීරතුංග වීඑස්වී එන්ඩීසී ජේඑස්එස්සී විසින් යුද්ධ හමුදා පාබල පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කරන ලද අතර, එහි ප්‍රථම සේනාවිධායක ලෙස ලුතිනන් කර්නල් ජීඑච් ද සිල්වා පත්වන ලදී. මෙම පුහුණු මධ්‍යස්ථානය ආධුනිකයින් පුහුණු කිරීම සඳහා ආරම්භ කර ඇතත් යුද්ධ හමුදාවේ ව්‍යාප්තියත් සමග නිලධාරීන් සහ සෙසුනිලයින් මෙන්ම වෙනත් පාඨමාලා ද ආරම්භ කරන ලදී. ඒ අනුව දැනට ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන් හා සෙසුනිලයින්, පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් හා සෙසුනිලයින් පුහුණු කිරීමේ පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් පහත සඳහන් පාඨමාලාවන් වාර්ෂිකව පවත්වනු ලබයි.

**බළඇණි ආධාරක අවි නිලධාරී පාඨමාලාව**

**තරුණ නිලධාරී පාඨමාලාව**

**බළඇණි ආධාරක අවි ජ්‍යෙකොනොනි/කොනොනි පාඨමාලාව**

**මිසයිල අවි පාඨමාලාව**

**බළඇණි ආධාරක අවි සංස්කරණ පාඨමාලාව**

**ආධුනික පුහුණු පාඨමාලාව**

තවද මෙම පුහුණු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පාබල ඒකකයන් සඳහා ස්ථාපිත කර ඇති ප්‍රධානතම පුහුණු පාසල වන අතර, බළඇණි ආධාරක අවි හා මිසයිල අවි පුහුණු කිරීම් සිදුකරනු ලබන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත් එකම පුහුණු මධ්‍යස්ථානයද මෙය වේ. මෙහි ආරම්භයේ සිට මේ දක්වා සේනාවිධායකවරු 38 දෙනෙකු අණදීම සිදුකර ඇති අතර, එම නිලධාරීන්ගේ උත්සාහය හා කැපවීම මත මෙම පුහුණු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ උසස් මට්ටමේ පුහුණු මධ්‍යස්ථානයක් බවට පත්කර ඇති අතර, "පුහුණුව තුළින් ප්‍රවීණත්වය" යන උදාර ආදර්ශ පාඨය පෙරදැරි කරගනිමින් පුහුණුවීම් ලබාදීම සිදුකරනු ලබයි.

> "වසර 36 ක ප්‍රෞඩ ඉතිහාසයක් ඇති මෙම පාබල පුහුණු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පාබල ඒකකයන් සඳහා ස්ථාපිත කර ඇති ප්‍රධානතම පුහුණු පාසල වන අතර, බළඇණි ආධාරක අවි හා මිසයිල අවි පුහුණු කිරීම් සිදුකරනු ලබන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත් එකම පුහුණු මධ්‍යස්ථානයද මෙය වේ"



තවද මෙම පුහුණු මධ්‍යස්ථානයේ මෑත ඉතිහාසය සළකා බැලීමේදී එහි සේනාවිධායක වශයෙන් රාජකාරි කරනු ලැබූ මේජර් ජෙනරාල් පීජේ ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ අදහසකට අනුව පුහුණු පාසලේ ප්‍රධාන පිවිසුම් දොරටුව නිර්මාණය කර මේජර් ජෙනරාල් එච්එම්ටීබී හංගිලිපොල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ධූර කාලය තුළ වැඩ ආරම්භ කොට, මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ධූර කාලය තුළ වැඩ අවසන් කර ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් 2020 සැප්තැම්බර් 24 වන දින උත්කර්ෂවත් ලෙස විවෘත කරන ලදී. එයට සමගාමීව අතිගරු ජනාධිපතිතුමන්ගේ අදහසකට අනුව යුද්ධ හමුදාධිපතිතුමන්ගේ "තුරු මිතුරු නව රටක්" යන සංකල්පය මත මෙම පුහුණු පාසලේ අඹ පැළ 100 ක් රෝපණය කරන ලදී. තවද මෑත භාගයේදී මෙම පුහුණු පාසලේ සියලුම මාර්ග කාපට් යොදා නවීකරණය කිරීමද සුවිශේෂී කාර්යයකි.

**ඉදිරිපත් කිරීම**
**පාබල පුහුණු මධ්‍යස්ථානය - මින්නේරිය**



යුද්ධ හමුදාධිපති පාබල පුහුණු පාසලේ නවතමයෙන් ඉදිකෙරූ ප්‍රධාන පිවිසුම් දොරටුව විවෘත කිරීමේ අවස්ථාවට එක්වෙමින්...



යුද්ධ හමුදාධිපති විසින් පාබල පුහුණු පාසලේ අඹ පැළ 100 ක් රෝපණය කිරීමේ කටයුත්ත ඇරඹීම සංකේතවත් කරමින් පළමු අඹ පැළය රෝපණය කිරීමේ අවස්ථාව...









# යුද්ධ හමුදා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය

*පසුගිය කලාපය හා සම්බන්ධවයි...*

යුද්ධ හමුදාව තුළ දැනට ක්‍රියාත්මක වන සුභසාධක වැඩසටහන් නිසි අයුරු පවත්වාගෙන යමින් නිලධාරී, සෙසුනිල සුභසාධනය වෙනුවෙන් නව වැඩ පිළිවෙලක් ඇති කිරීම හා සියලුම යුද්ධ හමුදා නිලධාරී/සෙසුනිලයින්ට හිමිවිය යුතු සුභසාධක පහසුකම් විධිමත්ව සහ ක්‍රමවත්ව සිදුවීම අධීක්ෂණය කිරීම සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වේ. එකී අරමුණු පෙරදැරිව සිදුකරනු ලබන කාර්යභාරය පිළිබඳ දැනුවත් කිරීමේ ලිපි මාලාවේ දෙවැන්න මේ සමග පළවේ.

**ණය අයදුම්පත් ඉදිරිපත් කිරීම**

සියලුම ණය අයදුම්පත් මාසිකව වෙන්කර ඇති සීමාව අනුව රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙතින් පමණක් ඉදිරිපත් කළ යුතුය.

**ඉඩම් අංශය**

අ. රාජකාරියේ යෙදී සිටින රණවිරුවන්ට නිවසක් ඉදිකර ගැනීමට ඉඩම් කොටස් නොමිලේ/ සහන මිලට ලබාදීම සඳහා ආරක්‍ෂක අමාත්‍යංශය සමග සම්බන්ධීකරණය සිදු කිරීම.

සුදුසුකම්

සක්‍රිය සේවයේ නියුතු සියලුම නිත්‍ය/ ස්වේච්ඡා සාමාජිකයින් අතරින් ඉඩම් නොමැති රණවිරුවන්, හමුදාගත සාමාජිකයින්ට මෙන්ම මියගිය/ අතුරුදහන් රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ට රණ සේවා අම වෙතින් විශේෂ නිර්දේශය මත ඉඩම් ලබාදීම. (සුසා/ඉඩම්/ප්‍රතිපත්ති/01/2012 හා 2012.09.11 දිනැති සුසාඅම ලිපිය මගින් සියලු රෙජිමේන්තු මධ්‍යස්ථාන දැනුවත් කර ඇත.

ආ. රජයේ ඉඩමක පදිංචි නමුත් ඔප්පු නොමැති යුද්ධ හමුදා සාමාජිකයින්ට ග්‍රාම නිලධාරී/ ප්‍රාදේශිය ලේකම් විසින් නිර්දේශිත අයදුම්පත අනුව ඉඩම් බලපත්‍ර ලබාදීම සඳහා නිර්දේශ ලබාදීම.

**<u>මරණාධාර අංශය</u>**

යුද්ධ හමුදා මරණාධාර යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන් වනුයේ සාමාජිකයන් පමණි. සාමාජිකයකු කුමන හේතුවක් මත මියගියද මරණාධාර මුදල් ලගම ඥාතියාට හිමිවේ. 2016.01.01 දින සිට රුඃ 100,000.00 ක මුදලක් ලගම ඥාතියා වෙත ගෙවනු ලැබේ. මෙම මුදල් අදාළ රෙජිමේන්තුව වෙතින් ළගම ඥාතියා වෙත ගෙවීමෙන් පසු අයදුම්පත වැහැලේ අම/පිපඅම අනුමැතිය මත සුසාඅම වෙතින් ප්‍රතිපූරණය කෙරේ.

**<u>නීති ආධාර</u>**

නීත්‍යානුකූල යුද්ධ හමුදා රාජකාරි ඉටු කිරීමේදී කරන ලද ක්‍රියාදාමයන් සම්බන්ධයෙන් සිවිල් අධිකරණයෙන් නඩු පැවරීමට භාජනය වන සියලු නිලධාරීන් හා සෙසුනිලයන් වෙනුවෙන් රුඃ 100,000.00 සිට රුඃ 500,000.00 දක්වා මුදල් ආධාර ලබාදීම සඳහා මෙම අරමුදල 2005.01.01 දින ආරම්භ කරන ලදී. එහෙත් ඊට වඩා වැඩි මුදලක් ලබාදීමට යුද්ධ හමුදාධිපතිතුමාගේ අනුමැතියෙන් පසු භාරකාර මණ්ඩලයට හැකියාව ඇත.

**<u>පාසල් අංශය</u>**

අ. ලකුණු ලබාදීම පහත පරිදි වේ.

- ⋆ සේවා කාලය සඳහා දිනකට ලකුණු - 0.137 (උපරිම දින - 1000)
- ⋆ ක්‍රියාන්විත එක් දිනක් සඳහා ලකුණු - 0.821 (උපරිම දින - 4500)
- ⋆ නිලයන් සඳහා (උපරිම ලකුණු 500)

| | |
|---|---|
| • කර්නල් නිලයේ සිට ඉහළට - 500 | බනි 1 - 350 |
| • ලුතිනන් කර්නල් - 450 | බනි 11 - 300 |
| • මේජර් - 400 | මා/සැ - 200 |
| • කපිතාන්/ලුතිනන් - 350 | සැරයන් - 150 |
| • ලුතිනන්(උපා) - 350 | කෝප්‍රල්. ලා/කෝප්‍රල් - 100 |
| • 2ලුතිනන්/උපපනි - 300 | සාසෙ - 50 |

පදක්කම් (උපරිම ලකුණු 1500)

- ⋆ **WV** - 1200 **WWV** - 1000 **RWP** - 700
- ⋆ **RSP** - 400 **USP/KSP** - 200
- ⋆ දේශපුත්‍ර පදක්කම - 100
- ⋆ ආබාධිත සේවයේ නියුතු (උපරිම ලකුණු 1000 දක්වා) ආබාධිත ප්‍රතිශතයට අනුව 1:10 අනුපාතයට උපරිම ලකුණු 1000.


නිනොනො දින ගණන අනුව ලකුණු අඩු කරන ආකාරය

| | |
|---|---|
| ⋆ දින 1-7 දක්වා - 100 | ⋆ දින 8-14 දක්වා - 200 |
| ⋆ දින 15-21 දක්වා - 300 | ⋆ දින 22-365 දක්වා - 500 |
| ⋆ දින 366-730 දක්වා - 750 | ⋆ දින 731-1095 දක්වා - 1000 |
| ⋆ දින 1096 සිට ඊට වැඩි - 1500 | |

ආ. තම ඒකකයට අයත් සියලුම අයදුම්කරුවන් ගෘහ මූලික පදනම මත තම පළාත තුළ (ජාතික හා පළාත්) පාසල් 10 ක් ඉල්ලුම් කිරීම අනිවාර්ය වේ.

ඇ. සියලු අයදුම්කරුවන් හට (යුද්ධ හමුදා පිළිවෙතට අමතරව) ගෘහ මූලික පදනම මත පාසල් ඉල්ලුම් කිරීමේ හැකියාව ඇත.

වැඩි විස්තර ඊළඟ කලාපයෙන් බලාපොරොත්තු වන්න.



ඉදිරිපත් කිරීම
යුද්ධ හමුදා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය

# සංචාරයක මතක සටහන්...

ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑච්එච් සෙනරත් බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් ඔක්තෝබර් 21 වන දින 515 වන බලසේනාවේ සංචාරයක නිරතවිය. බලසේනාධිපති බ්‍රිගේඩියර් පීඑන් ගොඩැල්ලවත්ත යූඑස්පී පීඑස්සී ගේ ආරාධනයෙන් සිදුකළ එම සංචාරය සිහිවීම පිණිස ආඥාපති විසින් පැලයක් ද රෝපණය කරන ලදී.



# කප්රුක පූජාවක්...

ත්‍රිකුණාමලය ජයසුමනාරාම විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය ඥාණකිර්ති හිමියන්ගේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් 22 වන පාබල සේනාංකයේ භටපිරිස් විසින් පසුගියදා එම විහාරස්ථානයේ පැවති "කප්රුක් පූජාව" සහ "පෙරහැර" මංගල්‍යය වෙනුවෙන් සිය දායකත්වය ලබාදුන්හ. 22 වන පාබල සේනාංකයේ සේනාකාධිපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ පවත්වනු ලැබූ මෙම පුණ්‍යෝත්සවය සඳහා දහම් පාසල් සිසුන් සහ ඔවුන්ගේ දෙමාපියන්, ගම්වාසීන් ඇතුළු බැතිමතුන් විශාල පිරිසක්ද සහභාගී වූහ.



# දරුවන්ට දිරියක්...

ඉකුත් ඔක්තෝබර් මස 01 වන දිනට යෙදී තිබූ ලෝක ළමා දිනයට සමගාමීව මුහමාලේ ප්‍රදේශයේ ජීවත්වන පාසල් දරුවන්ගේ අධ්‍යාපනයට රුකුලක් වීමේ අරමුණින් මුහමාලේ රෝමානු කතෝලික දමිළ මිශ්‍ර පාසලෙහි ඉගෙනුම ලබන දූ දරුවන් හට පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 02 වන දින පැවැත්විණ. 552 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ආර්පී මුණිපුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ මඟපෙන්වීම මත 23 වන ගැමුණු හේවා බළඇණියේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් පීඩීසී දිසානායක ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ සිදුකෙරුණු මෙම කටයුත්ත සඳහා එම පාසලේ විදුහල්පති, ගුරු මණ්ඩලය ඇතුළු සිසු සිසුවියන් විශාල පිරිසක් සහභාගී වූහ.



# ඒකක සංචාරයක නිරත වෙමින්...



53 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී විසින් 12 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, 1 වන ගැමුණු හේවා බලඇණිය, 5 වන ගැමුණු හේවා බලඇණිය යන ඒකකයන්හි ඉකුත් ඔක්තෝබර් 16,17,18 සහ 19 දිනයන්හි නිරීක්ෂණ සංචාරයක නිරතවිය. එහිදී ගුවන් සංක්‍රමික බලසේනාවේ නවතමයෙන් ඉදිකරන ලද මූලස්ථාන ගොඩනැගිල්ල සහ බනි/සැරයන් නිවස්තය විවෘත කිරීම ද ඔහු අතින් සිදුකෙරිණ.

# රුක් රෝපණයට උරදෙමින්...



591 වන බලසේනාව යටතේ පාලනය වන 24 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙතින් ඉකුත් ඔක්තෝබර් 05 වන දින අලම්පිල් දකුණ ග්‍රාමසේවා වසමෙහි තුමුලමුණේ දෙසට දිවෙන මාර්ගය දෙපස මී පැල 20 ක් රෝපණය කිරීමට කටයුතු කරන ලදී.

# සංවත්සර දිනයේ මතක සටහන්...



වර්ෂ 1969 දී නුවරඑළිය හිල් ස්කූල් හි ස්ථාපිත කළ 3 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට ඉකුත් සැප්තැම්බර් 25 වන දිනට වසර 51 ක් සපිරිණ. ඒ නිමිත්තෙන් වැඩසටහන් මාලාවක් ක්‍රියාවට නැංවුණු අතර, එහිදී මහා සංඝයා වහන්සේලා 25 නමක් උදෙසා සාංඝික දානයක් පිරිනමා මියගිය යුද්ධ හමුදා රණවිරුවන් හට පිං අනුමෝදන් කිරීම හා එම වීරෝදාර රණවිරුවන් වෙත පුෂ්පෝපහාර දැක්වීම, අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයක් පිරිනැමීම, සියලු නිල තේ පැන් සංග්‍රහයක් සහ දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම විශේෂ විය.





# විරු සරණින් නව සෙවණක්...

ආරක්ෂක සේනා (යාපනය) ආඥාපතිගේ සංකල්පයකට අනුව 7(ස්වේ) ගජබා රෙජිමේන්තුවේ වැඩ බලන අණදෙන නිලධාරී මේජර් ඩබ්ලිව්එස්අයි ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ගේ මගපෙන්වීම යටතේ ඒකක බලප්‍රදේශයට අයත් ජේ/328 කොඩිකාමම්(මධ්‍යම) ග්‍රාම නිලධාරී වසමේ පදිංචි ආබාධිත දරුවන් දෙදෙනෙකුගෙන් යුත් පවුලකට නව නිවසක් ඉදිකර දෙනලදී. ඉකුත් ඔක්තෝබර් 19 වන දින චාරිත්‍රානුකූලව සිදුකෙරුණු එම නිවස විවෘත කිරීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑච්ඒ සෙනරත් බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගි විය. තවද 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 522 වන බලසේනාවේ බලසේනාධිපති ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක්ද ඊට එක්වූහ. මෙම නිවස ඉදිකිරීම සඳහා ශ්‍රම දායකත්වය 7(ස්වේ) ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් විසින්ම සපයනු ලැබූහ.





# පුහුණු අභ්‍යාසයක්...

222 වන බලසේනාවේ භටපිරිස් විසින් ඔවුන්ගේ සෙවීම් සහ මුදාගැනීමේ කණ්ඩායම් සඳහා ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාසයක් ඉකුත් සැප්තැම්බර් 18 වන දින සේරුනුවර සිරිමංගල ගම්මානයේදී සංවිධානය කරන ලදී.

ගංවතුර කාලයට එරෙහිව හදිසි සැලසුම් පෙරහුරු කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් මෙම වැඩසටහන 22 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක වූ අතර, 222 වන බලසේනාවේ බලසේනාධිපති විසින් එම කටයුත්ත සම්බන්ධීකරණය කරන ලදී. මෙම අවස්ථාව සඳහා ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරක ද සහභාගී විය.





# ක්‍රීඩා උපකරණ පරිත්‍යාගයක්...

බුප්ජෝමුව දුම්රිය ස්ථාන බෝසත් සමාජ සත්කාරක පදනම මගින් තුන්වන වරටත් සංවිධානය කරනු ලැබූ බෙලිඅත්ත සිට කන්කසන්තුරය දක්වා ගමන් කරන විශේෂ පිරිත් දේශන දුම්රිය ඉකුත් සැප්තැම්බර් 26 වන දින රාත්‍රී 0700 පැයට ඕමන්ත දුම්රිය ස්ථානයේ දී නවත්වනු ලැබිය. එහිදී ඔවුන් විසින් කන්කසන්තුරේ ප්‍රදේශයේ සිදුකරනු ලබන සමාජ සත්කාරක වැඩසටහන සඳහා 21 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසුනිලයින් විසින් ද පාසල් උපකරණ කට්ටලයක් හා ළමා ක්‍රීඩා උපකරණ තොගයක්ද පරිත්‍යාග කරන ලදී. තවද ඕමන්ත මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති තනබාලසිංහම් මහතා විසින් ඔවුන් වෙත වියළි ආහාර පරිත්‍යාගයක්ද සිදුකළේය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 563 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් කේපීජ් පෙරේරා ආර්එස්පී, 21 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ජේඑම්ජේ පෙරේරා, ඕමන්ත විද්‍යාලයේ විදුහල්පති, ඕමන්ත දුම්රිය ස්ථානයේ ස්ථානාධිපති ඇතුළු ප්‍රදේශවාසීන් රැසක් සහභාගී වූහ.





# ලේ දන්දීමේ වැඩසටහනක්...

12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ උපදෙස් පරිදි සංවිධානය කෙරුණු ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 30 වන දින හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. මේ සඳහා නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.



# සංචාරයක මතක සටහන්...

64 වන සේනාංකයේ නව සේනාංකාධිපති ලෙස රාජකාරී භාරගත් බ්‍රිගේඩියර් ඒපී පල්ලාවෙල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉකුත් ඔක්තෝබර් 05 වන දින 641 වන බලසේනාවේ සහ 14 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සංචාරයක නිරතවිය. එහිදී සියලු නිලයින් ඇමතූ සේනාංකාධිපති ඔවුන්ගේ රාජකාරී ස්වභාවය සහ අවශ්‍යතා පිළිබඳ සිය අවධානය යොමුකරන ලදී.






# සංවත්සර දිනය අර්ථවත්ව සමරමින්...

1 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අභිමානවත් 64 වන සංවත්සරය ඉකුත් ඔක්තෝබර් 03 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. එයට සමගාමීව අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එම්එල්එල්ආර් මොල්ලිගොඩ යූඑස්පී වෙත සම්මාන පෙළපාළියක් පිරිනැමීම, ඒකක ධජයට සෙත්පැතීම උදෙසා ශ්‍රී දළදා මාලිගාවේ, කතරගම සහ අනුරාධපුර පුදබිමෙහි ආගමික වතාවත් සිදුකිරීම මෙන්ම ප්‍රජාසත්කාරයක් ලෙස අඹේපුස්ස දුම්රිය ස්ථානය පිරිසිදු කිරීම සිදුකරන ලදී.



# කඳවුරු නිරීක්ෂණ චාරිකාවක්...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාධිනායක මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය ඩබ්ලිව්ඩබ්ලිව්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී පසුගියදා 5(සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා කඳවුරෙහි නිරීක්ෂණ චාරිකාවක නිරතවිය. එහිදී ඒකකයේ පාලන කටයුතු සොයාබැලූ හෙතෙම එහි රුක් රෝපණයක් ද සිදුකරන ලදී. මෙම අවස්ථාවට ඒකක අණදෙන නිලධාරී මේජර් ආර්එම්එස්එස් රාජනායක ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.




# ගිමන් නිවන්නට නවාතැනක්...

5(සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ දීර්ඝ කාලීනව පැවති අවශ්‍යතාවයක් සපුරාලමින් කොහිලවගුරවත්ත, කරන්දෙණිය පිහිටි රෙජිමේන්තු ගොවිපළ පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකරන ලද "ලේක් වීව් ලෙෂර්" නිවාඩු නිකේතනය ඉකුත් සැප්තැම්බර් 10 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් සීකේ හඳුන්මුල්ල ගේ ප්‍රධානත්වයෙන් නිලධාරී/සෙසුනිල අයිතියට පත්කෙරිණ. කාමර තුනකින් සමන්විත එම නිවාඩු නිකේතනය නවීන පහසුකම්වලින් අංගසම්පූර්ණව මනරම් භූමියක පිහිටා ඇත. අණදෙන නිලධාරී මේජර් ආර්එම්එස්ජේ රාජනායක ගේ පූර්ණ මඟපෙන්වීම මත පරිත්‍යාගශීලීන්ගේ හා රෙජිමේන්තුවේ සහයෝගය ඇතිව ගොඩනගන ලද මෙම නිකේතනයට එම ඒකක සෙබළුන්ගේ ශ්‍රමදායකත්වය නොමඳව හිමිවූහ.





# ලෝක ළමා දිනය සමරයි...

24 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ටීඩී වීරකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් පරිදි එම සේනාංකයේ හටපිරිස් ලෝක ළමා දිනයට සමගාමීව අම්පාර නගර සභාව සහ සෙලාන් බැංකුව සමග එක්ව ප්‍රදේශයේ දරුදැරියන් දිරිගැන්වීමේ අරමුණින් වූ විශේෂ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 01 වන දින පවත්වන ලදී. තරග සහ විනෝද ක්‍රීඩා රැසක් ද සමගින් සංවිධානය කරන ලද එම වැඩසටහන අවසානයේ ජයග්‍රාහකයින් වෙත ත්‍යාග පිරිනැමීමටද කටයුතු කෙරුණි. දරුදැරියන්ගේ සුවිශේෂී ආකර්ෂණය දිනාගත් එම අවස්ථාව ඔවුනට නොමඳ ආශ්වාදයක් ගෙනදුන් අමතක නොවන දිනයක් විය.






# කෘත්‍රිම අත් පා බෙදාදීමක්...

221 වන බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්පී කාරියවසම් ගේ සම්බන්ධීකරණයෙන් ත්‍රිකුණාමලය හා ඒ අවට ග්‍රාම නිලධාරී කොට්ඨාශයන්හි තෝරාගත් ආබාධිත සිවිල් වැසියන් 44 දෙනෙකු වෙත කෘත්‍රිම අත් පා ප්‍රදානය කිරීම ඉකුත් සැප්තැම්බර් 27 වන දින ත්‍රිකුණාමලය නගර ශාලාවේදී පැවැත්විණ. ඒ සඳහා කොළඹ රොටරි සමාජයේ අනුග්‍රහය හිමිවූ අතර, එම වැඩසටහනෙහි ආරාධිත අමුත්තා ලෙස 22 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.




# කෝපායි සංහිඳියා කේන්ද්‍රය විවෘත කෙරේ...

මානුෂීය මෙහෙයුම නිමාවෙන් පසු යුද්ධ හමුදා සාමාජිකයින් විසින් තම ආවේණික රාජකාරීන්වලට අමතරව සිවිල් ජනතාවගේ ජන ජීවිතය නගාසිටුවීම වෙනුවෙන් විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නංවනු ලබයි. ඒ අනුව පීඩාවට පත් ජනතාවගේ ජීවනෝපාය නංවාලීමටත්, සංහිඳියාව ඇති කිරීම සහ ජනතාවට ශ්‍රී ලංකාද්වීපයේ නිදහසේ සාමකාමීව ජීවත්වීමට හැකි පරිසරයක් ගොඩනැගීම පෙරදැරිව යාපනය ආරක්ෂක සේනා ආඥාපති ගේ සංකල්පයකට අනුව කෝපායි ප්‍රදේශයේ නවතමයෙන් ඉදිකළ සංහිඳියා කේන්ද්‍රය 2020 සැප්තැම්බර් 29 වන දින විවෘත කරන ලදී. මෙම සංහිඳියා කේන්ද්‍රය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉඩම හා මූල්‍යමය දායකත්වය ත්‍යාගි පුණ්‍යායතනයේ නිර්මාතෘ වාමදේව ත්‍යාගේන්ද්‍රන් මහතා විසින් ලබාදුන් අතර, 51 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීඒඑල් රත්නායක ගේ මැදිහත්වීමෙන් ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදී.





# ප්‍රජා සත්කාරයකට උරදෙමින්...

යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව බෝගහපිටිය ශාන්ත වැඩිහිටි නිවාසය, ගල්කිස්ස කිතු සෙවණ මේරියන්ස් වැඩිහිටි නිවාසය, ගම්පහ සුව සෙවණ වැඩිහිටි නිවාසය, කෝට්ටේ ශාන්ත තෝමස් දේවස්ථානය සහ මහබාගේ වැඩිහිටි නිවාසය ආදී වැඩිහිටි නිවාසවල වැඩිහිටියන් හට වියළි සලාක පාර්සල් තොගයක් පරිත්‍යාග කිරීම ඉකුත් ඔක්තෝබර් 22 වන දින සිදුකෙරිණ. යුද්ධ හමුදාධිපති විසින් ලබාදුන් උපදෙස් මත යුද සේවා ලේකම් හා යුද්ධ හමුදා ක්‍රිස්තියානි සංගමයේ සභාපති මේජර් ජෙනරාල් පීජේ ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී විසින් මෙම පුණ්‍ය කටයුත්ත සංවිධානය කරන ලදී.

මෙම අවස්ථාවට මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ සහ යුද්ධ හමුදා ක්‍රිස්තියානි සංගමයේ ලේකම් බ්‍රිගේඩියර් එම්පී කරුණාරත්න අයිජී ඇතුළු නිලධාරීන් කිහිපදෙනෙක් සහභාගී වූහ.

# ශ්‍රී ලංකා පාබල හමුදාව

# “අභිමන් මුදුනත”













ශ්‍රී ලංකා මාතාවගේ සිංහ ලෙය දරා උපන් වීරෝදාර පුතුන්, සිංහ සෙයියාවෙන් රණබිම් හි සටන් වැද සිය ඔද තෙද, සුරු විරුකම් ලොව පුරා විසුරුවාලීය. එම වීර පුතුන්ගේ මහවිරුකම් මහා වංශයේ පරිච්ඡේද ගණනාවක් රන් අකුරින් පුරවා තිබේ. එම වීරෝදාර ලෙයින් පැවත එන ශ්‍රී ලංකා පාබල හමුදා රණවිරුවන් දශක තුනකට ආසන්න කාලයක් පැවති රුදුරු ත්‍රස්තවාදය මැඩලනු වස් ත්‍රස්තවාදීන් සමග සටන් වැදුණු අතර එහිදී පාබල හමුදා රෙජිමේන්තුවට අයත් රණවිරු නිලධාරීන් 141 ක් හා සෙසු නිලයින් 3144 ක පිරිසක් ප්‍රාණ දානයෙන් මව්බිම දිනවනවාත් සමග තවත් නිලධාරීන් 19 ක් හා සෙසු නිලයන් 456 දෙනෙක් අතුරුදන්ව ඇත. ඔවුන්ගේ ජීවිත පූජාව හා කැපවීම මව්බිමේ ජීවගුණය අර්ථවත් කර තිබේ.

1900 වසරේ පෙබරවාරි මස 01 වන දින දකුණු අප්‍රිකානු බෝය(ර්) යුද්ධයේදී දිවිපුදන ලද ලුතිනන් එච්ජ් තෝමස් විරුවාගේ සිට, පුදුකුඩුඉරිප්පු අවසන් සටනේදී දරුණු තුවාල ලැබ 2009 වසරේ අගෝස්තු මස 09 වන දා සිය ජීවිතය මව්බිමට දානය කළ ලාන්ස් කෝප්‍රල් සෙනවිරත්න ජේපීඩීඑස්ගේ රණවිරුවා දක්වා ශ්‍රී ලංකා පාබල හමුදාවේ රණවිරුවන් 3868 දෙනෙක් රට දැය වෙනුවෙන් සිය ජීවිතය පූජා කර ඇත. එම සියලුම රණවිරුවන් සිහිකරනු පිණිස නිර්මාණය කර ඇති මෙම රණවිරු ස්මාරකය "අභිමන් මුදුනත" නමින් අර්ථ ගන්වයි. එවකට යුද්ධ හමුදාපති සහ රෙජිමේන්තු අධිපතිව සිටි වර්තමාන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් දයා රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ උදාර සංකල්පයකට අනුව ශ්‍රී ලංකා පාබල හමුදා රණවිරුවන්ගේ හා ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ රණවිරුවන්ගේ ශ්‍රම දායකත්වයෙන්,

මෙම ස්ථානයට පැමිණෙන ඕනෑම අයෙකුගේ සිතට තම රට සහ මෙහි නිදන වීරයන් පිළිබඳව අභිමානයක්, ආඩම්බරයක් ජනිත වන අයුරින් මෙම අභිමන් මුදුනත නිර්මාණය කර ඇත. එසේම මෙම "අභිමන් මුදුනත" නිහඬව පවසන්නේ පරසතුරු ආක්‍රමණවලින්, මව්බිම නිවහල්කොට විශ්වාන්තර අභ්‍යවකාශයේ සැරිසරන්නා වූ උත්තරීතර රණවිරුවන්ගේ මව්බිම පිළිබඳ ඇති වීරත්වයේ බලාපොරොත්තුවයි.

මෙම අභිමන් මුදුනත සෙබළාගේ ජීවාත්මයේ ප්‍රතිමූර්තියකි. එහි නිර්මාණය කර ඇති සියලුම අංගයන් මනා අදහසක් පිළිබිඹු වන අයුරින් නිමවා ඇත. ස්මාරකයේ පිවිසුම දෙපස ඇති විශාල සිංහ රූප දෙක මගින් වීර රණභූමියකට ඇතුල්වීමද, කොටස් හතරකින් යුත් පියගැටපෙළ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණයන් ද, අට දිශාවට නෙත් යොමා සිටින සිංහ රූප අටෙන් යුද්ධය නිමා වුවද සෙබළුන් අවදියෙන් යන අර්ථයද, සිව් දෙසින් මුදුනත දක්වා විහිදෙන කුළුණු හතරෙන් සිව් දෙසින් රට රැකුමට වීරයින් පෙරට පැමිණි බව සහ ස්මාරකය මධ්‍යයේ පිහිටි කුළුගෙඩි පහරවල් සලකුණු කර ඇති විශාල හතරැස් ඝණ කුටීරය මගින් සෙබළා සතු ශක්තියද පෙන්නුම් කරන අතර, මතුපිට පෘෂ්ඨයට යටින් ඉදිවී ඇති උමං මාවතෙහි අපගේ වීර මුතුන්මිත්තන් රට දැය වෙනුවෙන් යුධ වැදුනු අයුරු සහ මානුෂීය මෙහෙයුමේදී යුධ වැදුනු වීර සෙබළ චරිත මූර්ති ආකාරයෙන් නිමවා ඇත. තවත් මෙවැනි සුවිශේෂී අදහස් වලින් යුත් නිර්මාණ රාශියක් මෙම අභිමන් මුදුනත හි නිමවා ඇත.

තවද මෙම අභිමානවත් ස්ථානය නැරඹීමට පැමිණෙන ප්‍රාණ දානය දුන් රණවිරුවන්ගේ ආදරණීයයන් හට තම පුතණුවන්, ස්වාමියා, පියා, සහෝදරයාගේ වීරත්වය විදහාලන සහ ඔහු තම රට වෙනුවෙන් ප්‍රාණ දානයෙන් යුක්තව කළ සේවය අළලා සැකසූ වීඩියෝ පටයක්ද නැරඹීමේ හැකියාව පවතී. ඒ සඳහා නූතන තාක්ෂණික ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණයන්ගෙන් පරිපූර්ණ වූ දේශණ ශාලාවක් මෙම ස්ථානයේම පිහිටුවා ඇත.

එමෙන්ම මෙම අභිමන් මුදුනතෙහි නම් සඳහන් රණවිරුවන්ගේ ඥාතීන්ගේ සහ රෙජිමේන්තුවට අයත් සියලු නිලධාරීන් සහ සෙසු නිලයින්ගේ සහභාගීත්වයෙන් වර්ෂ 2015 සිට සෑම වසරකම ඔක්තෝබර් මස අති උත්කර්ෂවත් අන්දමින් රණවිරු සැමරුම් උළෙලක් පවත්වනු ලබන අතර, මෙහිදී සියලු රණවිරුවන් සිහිකර සර්ව ආගමික වතාවත් සහ මල් කලඹ තැන්පත් කිරීම සිදුකරනු ලබයි. අවසන් වරට 2019 වර්ෂයේදී පැවති රණවිරු සැමරුම් උළෙල වන්මන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා පාබල හමුදාවේ නිලධාරීන්, සෙසු නිලයින් සහ රණවිරු දෙමාපිය ඥාතීන්ගේ සහභාගීත්වයෙන් අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණ.


දේශය වෙනුවෙන් දිවිපිදූ සියලු රණවිරුවන් හට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතරම, එම රණවිරුවන් රට ජාතිය වෙනුවෙන් පූජා කරන ලද ඔවුන්ගේ ආදරණීයයන් හටද පැහැබර අනාගතයක් උදා වේවායි අපි එක්සිත්ව ප්‍රාර්ථනය කරමු.

*ඉදිරිපත් කිරීම - රෙජිමේන්තු මධ්‍යස්ථානය*
*ශ්‍රී ලංකා පාබල හමුදාව*

**"1996 ජූලි 18 දින සිදුවූ මුලතිව් ප්‍රහාරය වූ කලී ගෙවුණු තිස්වසක යුද ඉතිහාසය තුළ ත්‍රස්තවාදීන් හමුවේ අප ලැබූ දරුණුතම පරාජයකි. එහිදී විනාශ වූ ජීවිත සංඛ්‍යාව 1,400 කට ආසන්න වූ අතර, අහිමි වූ හමුදා දේපළ ද අතිවිශාලය. එනමුත් එම සටනේදී සතුරා කොතරම් බලවත් වුවද අවසන් මොහොත තෙක් නොබියව ඔවුනට මුහුණදුන් විරුවන් සේම ජීවිත බේරාගෙන පැමිණීමට සමත් වූ පිරිසක්ද සිටි බව බොහෝ දෙනෙකු නොදනී. එම ප්‍රහාරය හමුවේ දිවි බේරාගත් අතලොස්සක් දෙනා අතර 6 වන විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් නිලධාරියෙකු හා සෙබළු 20 දෙනෙකු වූහ. එම පිරිස අතරින් 10 දෙනෙකු දිවි බේරා ගන්නා ලද්දේ ප්‍රහාරය අතරතුර කඳවුරු මධ්‍යයේ නිවසක වහලයේ සිමෙන්තියෙන් බඳින ලද අතහැර දැමූ කුඩා වතුර ටැංකියක සැඟවීමෙනි. බිමට දිය උගුරක් හෝ කුසට කිසිදු අහරක් නොමැතිව දින ගණනාවක් ගතකරන ඔවුන් අවසන් මොහොතේ සිය ජීවිත බේරා ගැනීමට සමත් වනුයේ සතුරු භූමියේ කිලෝමීටර් 34 කට වැඩි දුරක් ඇවිද එමින් සති ගණනාවක් තිස්සේ කළ අසීමිත කැපකිරීම් හමුවේය"**

# මුලතිව් සටනේ අප්‍රකට කතාවක්...

කාලයේ වැලිතලාවෙන් වැසී ගිය යුදබිම තුළ සිදුවූ ඉහත අපකට සංවේදී සත්‍ය කතාව මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් මෙලෙස ඔබ වෙත තිළිණ කෙරෙනුයේ පුරා වසර තුනකට වැඩි කලක් තිස්සේ ඔහු විසින් සිදුකළ අඛණ්ඩ හා ගැඹුරු ගවේෂණයකින් අනතුරුවය.




රණබිම තුළ සතුරන් අභිමුව පෙරමුණේ සටන් වැදීම අතිශය බිහිසුණු අවදානම් සහගත කාර්යයකි. එබැවින් ඊට මුහුණදෙන ඕනෑම අයෙකුගේ වීරත්වය හා එඩිතර බව පිළිබඳ විවාදයක් නොමැත. එසේම සංග්‍රාමයේ අසීරු අවස්ථාවලදී ගැලවී ඒමට හැකියාව තිබියදීත් තම සගයන් දමා යා නොහැකිව මියෙන තුරුම සටන්වැදී විරුවන්ද, දහස් ගණන් සතුරු සමූහය මැද සියලු කාරණා සතුරන්ගේ වාසියටම හැරවී ඇති පසුබිමක ඔවුන්ගේ උකුසු ඇස් මගහැර කිසිවෙකු ජීවිතය බේරා ගැනීමට සමත් වන්නේ නම් එය ද ආශ්චර්යයක්ම වන්නේය. එය වූ කලී දරාගැනීම, ඉවසීම හා අසීමිත කැපකිරීම හමුවේම පමණක් සිදුවන්නක් වන අතර යුධ සෙබළෙකුට හැර අන් කිසිවෙකුට එය කළ හැකිද නොවේ. එබැවින් ඔවුන්ගේ එකී මෙහෙවරද ඓතිහාසිකව ඇගයීමට බඳුන්විය යුතුමය. පුද්ගලයෙකුට ජීවිතය හමුවේ කළ හැකි කැපකිරීම්වල සීමාව කොතෙක්ද? ඒ අසීමාන්තික කැපකිරීම රණවිරුවකුට හැර අන් කිසිවෙකුට කළ හැකිද? මේ පොත හරහා කතුවරයා කියන්නට උත්සාහ ගන්නේ එයයි.

අපට යුද්ධයේ නටබුන් ඉතිරි කළ නොහැක. කළ හැක්කේ එකී අත්දැකීම් මතු පරපුරට දැන කියාගන්නට ඉඩ හැරීමය. එය අද දිනයේ අප කවුරුන් හෝ කළ යුතුය. යුද්ධයේ අත්දැකීම් සහිත හැමෝටම කියන්නට කතාවක් ඇත. තිස් වසක් තිස්සේ රණබිම තුළ ඔවුන් ඇස දුටු අත්දැකීම් එකී හදවත් තුළ තෙරපෙමින් කැකෑරෙමින් තිබේ. ඔවුන් විශ්‍රාම යාමට පෙර එකී කතා සමාජගත කිරීමේ වැදගත්කම මතුවන්නේ එබැවිනි. ඒ සඳහා අප රට තුළ යුධ සාහිත්‍යක් බිහිකිරීම අනිවාර්ය අවශ්‍යතාවයකි. සිය කෘතීන් හරහා මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ නිහඬව කැපවෙමින් සිටිනුයේ එකී මෙහෙවර උදෙසාය.



**මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ "රණවිරුවා - සංස්කාරක" ලෙස කටයුතු කරන මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ "මරණය මැදින් මුලතිව් සිට" නම් වූ සිය නවතම කෘතිය සමග අප හමුවට පැමිණීමට නියමිතය. දැනටමත් ඒ සඳහා යුද්ධ හමුදාධිපති තුමාගේ අනුමැතිය හිමිව ඇති අතර, පවතින කොරෝනා තත්වය සමනය වූ වහාම යුද්ධ හමුදාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් එය යුද්ධ හමුදා මූලස්ථානයේදී එළිදැක්වීමට අපේක්ෂාවෙන් පසුවේ. තත් නිලධාරි මීට ඉහතදී ද යුද අත්දැකීම් ඇසුරින් රචිත ග්‍රන්ථ රැසක්ම යුද්ධ හමුදාවේ අනුමැතිය ඇතිව එළිදක්වා ඇති අතර, එළඹෙන වසරේදී ප්‍රකාශයට පත්කිරීමට නියමිත "1990 යාපනය කොටුව මුදා ගැනීම, අවසන් මානුෂීය මෙහෙයුමේ අප්‍රකට කතාවක්, වච්චනිව් ප්‍රහාරය" ඇතුළු කෘතීන් කිහිපයකම පර්යේෂණ කටයුතු දැනටමත් අරඹා ඇත.**

ලුතිනන් කර්නල් චිපීවන් සමන්ති - ජාතිම



විහගි
තත්සරා



කවීෂ
ලක්මින



ඉසිරි
උමන්දි



අහිනෙත්
අකිඳු



සලගි
නෙත්සරා



කවිෂ්ක
ප්‍රමෝද්



ප්‍රමුදිත
නෙත්සර



ශවිනි
සෙලේනා

# හිරු තරු සේ දිලෙන විරු දරු සැමරුම්

**මල් කැකුළු වන් රණවිරු දුවා දරුවන්ට සුව සැපත,**
**ජය සතුට පිරි වාසනාවන්ත උපන් දිනයකට**
**"රණවිරුවා" මෙලෙස සුබ පැතුම් එක්කරයි.**

## මව් සෙනෙහසක ජීවය...

විටෙක නුඹ නොසැලෙන...
මහා දැවැන්ත කළුගල් පර්වතයකි...
විටෙක ඔබ දුක් වේදනා උසුලන කඳුලු ගංගාවකි...
ඔබේ සෙනෙහසට අකුරින් අකුර අමුණා...
කවි ගී ලියා නිමකළ නොහැක...

දරු සෙනෙහසට උණු ලේ කිරට හරවා පෙවූ...
අම්මා මේ විශ්වය තුළ ජීවත්වන...
මිල කළ නොහැකි වස්තුවකි...
උහුලනු බැරි තරම් දුක් වේදනාවක්...
උහුලමින් කඳුලු සඟවන්නට හැකි...

වෙස් මුහුණු බැඳගත්...
මොහොතින් මොහොත වෙනස් වන...
කිසි දින විශ්වාස කරන්නට නොහැකි...
අපිරිසිදු සිත් ඇති මිනිසුන් අතරේ...

හිත තුළ කොතැනකවත් කහටක් නොමැතිව...
සෙනෙහස ගැබ්ව පිරිසිදුව සිනාසුනු එකම පිරිසිදු සිනාව ඇති...
කිසිවෙකු නොදැන රැකවරණය ලබාදුන්...
අම්මේ ඔබ ඒකාන්තයෙන්ම බුදු වෙනවා...
බුදුවන්නට ඔබ පෙරුම් පුරන්නට අවැසි නැත...

සෙ/239986 බනි 1 ඒඑච්ටීපී මහින්ද කුමාර
විදේශීය මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය
කොළඹ

## ආදරණීය අම්මා...

සඳේ තනියට පුංචි තරුවක්
පායලා ඇත හිනැහිලා...
මගේ තනියට ඔබේ හසරැලි
මා ළඟින් ඇත දැවටිලා...
කාලයේ කළු වලා රොදවල්
එබී බැලුවත් සැඟවිලා...
අම්මේ... ඔබ එපා යන්නට
ඉන්න සැමදා ලංවෙලා...

සෙ/ඕ100483
කෝප්‍රල් වාසල ඩබ්ලිව්එම්එස්පීකේ
5 (සෙව) ශ්‍රීලයුපොදුසේබ

## පුදුම ජීවිතේ...

ජීවිතයේ සමහර තැන් තිබුණා
දුකක් දැනුණත්
කියන්න කවුරුත්ම නැතිවුන.

හිත හුඟක් අසරණ උනත්
හැමදේම දරන්
ලෝකෙට පේන්න හිනාවුන

කරන්නම දෙයක් නැතිතැන
අකමැතිම දේටත් කැමතිවුන

ජීවිතේ හරිම පුදුමයි
හිතෙන්නෙම හැමදාම
හැමදේම දුකක් විතරයි...

සෙ/286726
සංසෙ(කා) මදුරප්පෙරුම
6 ශ්‍රීලංසංබ



# සිතුවිලි සාගරය....

## මා පිය වරුණ...

නොමේරූ වියේ ලේ කැටියක් විලසින්නේ
මේරූ වියේ දරූ කැළලක් විලසින්නේ
මෙලෙස දස මසක් කුස තුළ දරමින්නේ
විඳි දුක් ගැහැට මව් තුමියනි අපමණවේ

පියතුම ජනිත කළ පුතු ආදරණීය
හැඩි දැඩි කරන්නට විඳි දුක් අපමණය
අදටත් ඔබගෙ රැකියාවෙහි නියැලේය
අප දෙස බලා ඔබ සතුටක් නොවිඳිද

පතනෙමි පැතුම් මතු භවයේ ඉපදේවා
මව් තුමියනේ ඔබ කුස පිළිසිඳේවා
පියතුම ඔබට දාවම මා බිහිවේවා
වැඳු මව්පියනි ඔබ දෙපළම බුදුවේවා

සෙ/12එච්00974
ච/සැරයන් යහම්පත් කේඑච්ට්
කොඇව්වි - රත්මලාන

## බලාපොරොත්තුව...

ඇතුගල කන්ද වගේ
මං නුඹව දරාගෙන උන්නා...
නුඹ මහ වැස්ස වගේ
දුකම අරගෙන කඩන් වැටුණා...

ප්‍රතික්ෂේප ප්‍රේමයක් ලඟ
හඬා වැටෙන්නට නොහැකි හින්දා...
අදත් තනියම බලාගෙන ඉම්
මහමෙරක් වූ බර දරා...

හීන හන්ගච්චක් එහා ගොස්
කුරුළු ඇස් ලඟ නැවතුනා...
උපදිනා හැම සසර භවයෙම
නුඹේ වෙන්නට බලන් උන්නා...

සෙ/59424
බනි 1 කේඑස්සීජී කැන්දවල
1 ශ්‍රීලයුකාබ

## සුදු දෝණි...

තැවුල් දුරලූ රන් කඳක්
උනා නුඹ මට පුර හඳක්
මටම වොලූ පින් කඳක්
මගේ වුණ සෙව්වන්දියක්

ප්‍රේමයට නව එක නමක්
හදින් නැගෙනා හිමි නමක්
සෙනෙහෙ ගලනා පෙම් ගඟක්
නුඹ නොවෙද සුදු හංසියෙක්

පෙමින් වෙළිලා කාලයක්
උනත් නෑ කිසි පාළුවක්
හිදිනම් තව තිල් මැණික්
ඒ අපේ රන් දියණියක්...

සෙ/285894
ලා/කෝ දයානන්ද එච්ඒඑම්එන්
3 ශ්‍රීලංසංබ

## මතක හිටින බූට් පාරක්

උසස් පෙළෙහි සිට ඔබ මා     හඳුනන්නේ
මිතුරු දමින් එහා දෙයක් නැත     සිතුනේ
නොසිතු ලෙසින් හමුදාවට මා     බැඳුනේ
හත් වසකින් පසු මා ඔබ     දුටිමින්නේ

වෙනදා ලෙසින් නොව ඔබනම්     වෙනස්වෙලා
මුහුණෙන් පෙනුමෙනුත් සිත් සේ     හැඩවිලා
මිතුරු දමට එහා දෙයක් මට     දැනුණා
මිතුරු දමත් නැතිවේදැයි මට     සිතුණා

ඔබගේ ආදරේ මා හට     දෙනවාද
ඇසුවා මෙමා දෙවරක්වත්     නොසිතාම
මම කැමතී කීවා ඇය     පෙරළාම
පුරුවෙ කළ පිනකැයි මට     සිතුනේය

දෙගුරුන් හට අප ගැන අපි     පැවසුවා
කේන්දරේ පිටපත් සැම     බැලවූවා
විවාහයට දින එහෙමත්     දැන්වූවා
ලැබෙන බබාලට නම් හෙම     ගැලපූවා

කේන්දරේ අවුලක් වී ඇත     මිතුර
සියට අසූවක් ගැළපෙන් නැහැ     සොඳුර
ඒ මොක වුනත් ඒ ගැන නොසිතා     නිතර
වෙනදා වගේ ආදරයෙන් ඉම්     කොඳුර

ආදරයට වසර දෙකක්     ගතවූවා
දැන් දැන් රණ්ඩු සරුවල්නම්     සිදුවෙනවා
මැණික කියූ මට යෝදියෙ     කියවෙනවා
කේන්දරේ බලගතු බව     පෙන්වනවා

ආලය දැන් ඇති කියමින් ඇය     කීවා
අපි මෙය නවත්තමු යැයි එකවර     කීවා
මෙය පුරුවේ කළ පව යැයි මම     කීවා
මතක හිටින බූට් එකක් මම     කෑවා

සෙ/753797
කෝප්‍රල් කුමාරසිංහ එම්පීඑච්එම්
11 ඉසේරේ

## මැඩලමු අපි කොරෝනා...

ගං වතුරට, සුළි සුළඟට නැතිවම     බේරුවා
සුනාමි හා නායයෑම්     පැරැද්දුවා
අන්තවාදි ප්‍රහාරයන් නැති     කෙරුවා
රට දැය එක් සේසත් කර කල්     මැරුවා

මුළු ලොව ගිලගන්න කොවිඩ් මඟ     බැලුවා
ලොකු පොඩි කිසි වෙනසක් නැහැ ඔහු     එනවා
අවියෙන් බැහැ එනමුදු සටනට     ආවා
කොරෝන තිබුණත් අපි නොබියව     එනවා

නොබියව මුහුණ දෙනවා රට රැක     ගන්න
පෙනෙනා නොපෙනෙනා කරදර     දුරලන්න
කැපවුන තරම දන්නව කවුරුත්     ඔන්න
තිරයෙන් පිටුපසට වී විරුවා     ඉන්න

සංග්‍රාමික හැකියාවයි හැම     තැනම
සාමූහික,ශක්තිය,කැපවීම     මත
මැඩලන්නෙමු අපි කොරෝනා     වසංගත
ජනතාවනේ දෙනු සහයෝගය     අපට

සෙ/3ආර්01562
මා/සැරයන් රංජිත් එස්ඩීඩී
3(සෙවි) ශ්‍රීලයුකාබ

## වේදනාව...

සැනසෙන්නම බැරි වේදනාවක්
සිතන්න පවා අකමැති වෛර බඳින
අතීතය මතකයට නැගෙන හැම විටම
අනන්ත වාරයක් මේ භවයේ...

දෑසට උරුමවී ඇති කඳුළු
ගලාවිත් වැටියත් මේ පපුවට
නිවන්නට උහුලන්න බැරි ගින්දර...

සෙ/286413
සංසෙ වෙත්තසිංහ ඩබ්ලිව්එස්සී
1 ශ්‍රීලංසංබ

## ඔබයි මගේ ලොව අම්මේ...

පෙකනි වැලේ එල්ලීගෙන
වතුර විලේ පීනාගෙන
මතකයි මම නැටුව එදා
ඔබ කුස පිරිමැද්ද නිසා
ඔබේ පියයුරු බලා සිටියා
මා දෙතොලත සිර වන්නට
මමත් බලන් හිටියා තමා
අමෘතයම වගේ කියා
කාලය ගෙවිලාම ගියා
දිනක එදා ඔබෙ තුරුලට මා ආවා
සඳ ලස්සන නෑ මට
තරු දිලිසුනේ නෑ ඒ තරමට
සත්තයි අම්මේ
ඔය ඇස් දිලිසුනා ඒ තරමට
දින සති මාස ගෙවිලා
මා පිරිපුන් වූදා
දුටුවා ඔය ඇස් එදා වගේමයි
අදටත් ඔය හද මා වෙනුවෙන්මයි
සත්තයි අම්මේ
ඔබයි මගේ ලොව

කපිතන් සීඩබ්ලිව්ටීඑස්එස් ලියනවඩු
11 විපාරෙ

## අහිමි ආදරය...

සිත දවන නෙතු තැවෙන
සුසුම් ගී අවුලුවන
ළඟ ළඟම ලැඟුම් ගෙන
බෝ දුරට පාව යන
අහිමි වග දැන දැනම
මම හුගක් පෙම්කරන බව
දන්නවද නුඹ ඒක...

සෙ/ඊ100461
කෝප්‍රල් රත්නායක එල්පීසීබී
3 ශ්‍රීලංසිරෙ

# වෘත්තීය
# අනේකවිධ කඩ
# සුබ මොහොතින් නව තනතුරු ලැබූ
# රැකවරණය
# "රණවි
# මෙසේ සුබ පැ



යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික
ප්‍රධානී ලෙස
මේජර් ජෙනරාල්
එම්ඊඩී සිරනාග
2020 ඔක්තෝබර් මස 01 දින සිට



ආරක්ෂක සේනා (මධ්‍යම)
ආඥාපති ලෙස
මේජර් ජෙනරාල්
එච්එච්වන්නිගේ ජයපතිරණ ආර්එස්පී
2020 ඔක්තෝබර් මස 26 දින සිට



ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ
කර්නල් සේනාවිධායක ලෙස
මේජර් ජෙනරාල්
ජේඑන්එස් කොටුවේගොඩ
එන්ඩීසී අයිපී
2020 ඔක්තෝබර් මස 29 දින සිට



ආරක්ෂක සේනා (වන්නි)
ආඥාපති ලෙස
මේජර් ජෙනරාල්
ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ
2020 ඔක්තෝබර් මස 23 දින සිට



ඉදිරි නඩත්තු පෙදෙස (උතුර)
ආඥාපති ලෙස
බ්‍රිගේඩියර්
පීඩබ්ලිව්එල් මාහින්සන්ද

2020 ඔක්තෝබර් මස 07 දින සිට



II වන පාබල
සේනාංක මූලස්ථානයේ
සේනාංකාධිපති ලෙස

මේජර් ජෙනරාල්
එස්එම්එස්පීබී
සමරකෝන්
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී

2020 ඔක්තෝබර් මස
10 දින සිට



පාබල පුහුණු මධ්‍යස්ථානයේ
සේනාවිධායක ලෙස
බ්‍රිගේඩියර්
පීආර්ආර්පී ජයවර්ධන
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී
2020 ඔක්තෝබර් මස 29 දින සිට



ඉදිරි නඩත්තු
පෙදෙස(කිළිනොච්චිය)
ආඥාපති ලෙස
බ්‍රිගේඩියර්
එම්ඒඩීපී නානායක්කාරවසම්
2020 ඔක්තෝබර් මස 29 දින සිට



මානව හිමිකම් හා මානුෂවාදී නීති
අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස
බ්‍රිගේඩියර්
කේඑච්කේ කෝට්ටවත්ත
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී

2020 ඔක්තෝබර් මස 26 දින සිට



සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ
සේනාවිධායක ලෙස
කර්නල්
පීපීජී ගුණසේකර යූඑස්පී
පසුගියදා සුබ මොහොතින්
රාජකාරි අරඹමින්




572 වන බලසේනාවේ
බලසේනාධිපති ලෙස
කර්නල්
එම්පීඑන්ජී මුතුමාල යූඑස්පී පීඑස්සී
2020 ඔක්තෝබර් මස 29 දින සිට



වන්කම්
කළමණාකරණ
අධ්‍යක්ෂ මණ්ඩලයේ
අධ්‍යක්ෂ ලෙස
බ්‍රිගේඩියර්
එස් කස්තුරිමුදලි
ආර්එස්පී පීඑස්සී
2020 ඔක්තෝබර්
මස 23 දින සිට

දිවියේ
ඉම් පසුකොට
ඔබ සියලු දෙනාට දිරිය, විරිය,
ලැබේවායි
රුවා" ද
තුම් එක්කරයි.

641 වන බලසේනාවේ
බලසේනාධිපති ලෙස
කර්නල්
ඩීඩබ්ලිව් ජයවර්ධන යූඑස්පී
2020 ඔක්තෝබර් මස 27 දින සිට



රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ
කර්නල්(රැකියා සම්බන්ධීකරණ) ලෙස
කර්නල්
එච්එස්පී ජයම්පති යූඑස්පී
2020 ඔක්තෝබර් මස 23 දින සිට




ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම)
කර්නල් (සම්බන්ධීකරණ) ලෙස
කර්නල්
ඩබ්ලිව්එම්ඩබ්ලිව්එන්ඩීබී වීරකෝන්
ආර්ඩබ්ලිව්පී යූඑස්පී
2020 ඔක්තෝබර් මස 26 දින සිට



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී
බළකායේ අණදෙන නිලධාරී ලෙස
කර්නල්
අයිඩීඩී ප්‍රනාන්දු
පසුගියදා සුබ මොහොතින්
රාජකාරි අරඹමින්



ආරක්ෂක සේනා
මූලස්ථානය(බටහිර)
කර්නල් (ප්‍රමාණ) ලෙස
කර්නල්
බීඑම්ජී බාලසූරිය
ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී
2020 ඔක්තෝබර්
මස 20 දින සිට



ගුවන් සංග්‍රාමික පුහුණු පාසලෙහි
සේනාවිධායක ලෙස
කර්නල්
ඩබ්ලිව්එම්එස්බී ජයතිලක ආර්එස්පී යූඑස්පී
2020 ඔක්තෝබර් මස 30 දින සිට



59 වන සේනාංකයේ සිවිල්
සම්බන්ධීකරණ නිලධාරී ලෙස
ලුතිනන් කර්නල්
පේරවල් ද සොයිසා
2020 ඔක්තෝබර් මස 05 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය(බටහිර)
කර්නල් (පාලන/හකාස) ලෙස
ලුතිනන් කර්නල්
ඊඑම්එස් ජයරත්න ආර්එස්පී
2020 ඔක්තෝබර් මස 05 දින සිට



14 (සෙවි) ඉංජිනේරු සේවා
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
ලුතිනන් කර්නල්
එස්ඩීවීන් සූරියප්පෙරුම යූඑස්පී
එල්එස්සී
2020 ඔක්තෝබර් මස 07 දින සිට



5(සෙවි) බලඇණිය
යාන්ත්‍රික පාබල
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී
ලෙස
මේජර්
ජේආර්ඒ සිල්වා
පසුගියදා සුබ
මොහොතින් රාජකාරි
අරඹමින්



10 වන ඉංජිනේරු සේවා
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
මේජර්
එච්කේසියේ හෙට්ටිආරච්චි
2020 ඔක්තෝබර් මස 07 දින සිට



4(සෙවි) ඉංජිනේරු සේවා
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
මේජර්
පීජී බන්දුල යූඑස්පී එල්එස්සී
2020 ඔක්තෝබර් මස 05 දින සිට





# හොලොප්පං

## තුන්දෙනෙක් වෙලා...

**නිමල්** - හලෝ... නැන්දම්මේ.... අලුත් ආරංචියක් කියන්ඩ ගත්තෙ...

**නැන්දම්මා** - ඇයි පුතේ...? මොකද වෙලා තියෙන්නෙ...?

**නිමල්** - ඔන්න අපි දෙන්න තුන්දෙනෙක් වෙන්න යන්නෙ...

**නැන්දම්මා** - අනේ පුතේ... දුවෙක්ද පුතෙක්ද...?

**නිමල්** - නෑ...නෑ... අම්මගෙ දුව වෙන මිනිහෙක් එක්ක යාළුවෙලා...



## ජෝබ් එක...

කොල්ලෙක් ගියාලු තමන් යාළුවෙලා ඉන්න කෙල්ලගෙ ගෙදර... ඔන්න ඉතිං කෙල්ලගෙ තාත්ත කොල්ල එක්ක කතා කරනවලු...

**තාත්තා** - පුතා ජෝබ් එකක් එහෙම කරනවද...?

**සුපුන්** - ඔව් තාත්තෙ... මං ෂා **FM** එකේ වැඩ කරන්නෙ...

**තාත්තා** - මොකක්ද ඒකෙ කරන ජෝබ් එක...?

**සුපුන්** - මං තමයි සිංදුව මැද්දෙන් ෂා... කියන්නේ...



## පියාඹන පීරිසි...

**නිමල්** - සුසන්ත... උඹ පියාඹන පීරිසි දැකල තියෙනවද...?

**සුසන්ත** - නෑ බං... උඹ දන්නවද පියාඹන පීරිසි බලන්ඩ පුලුවන් විදියක්...?

**නිමල්** - ඉක්මනට බැඳපන්... එතකොට බලාගන්ඩ පුළුවන්...



## ඔරංඔටං...

ඉස්කෝලෙක ට්‍රිප් එකක් ගියාළු සත්තු වත්ත බලන්ඩ...

**සර්** - මොකද ඔය ළමය අඩන්නෙ...

**සුපුන්** - සර්... උක්කුං මට ගැහුවා...

**සර්** - ඇයි උක්කුං මේ සුපුන්ට ගැහුවෙ...?

**උක්කුං** - සර්... සුපුන් මීට සති දෙකකට කලින් මට ඔරංඔටං කියල බැන්න...

**සර්** - සති දෙකකට කලින් බැන්නනම් ඇයි තමුසෙ දැන් මේ ළමයට ගැහුවෙ...?

**උක්කුං** - ඇයි කියල අහන්නෙ සර්... අදනෙ මං ඔරංඔටංව හරියට දැක්කෙ සර්...

## සිංහල පාඩම...

**ටීචර්** - සඳුනි... කියන්ඩ බලන්ඩ අලි ඇතුන් මාරුවෙන තැනට මොකක්ද කියන්නෙ කියල...?

**සඳුනි** - අලි මංකඩ ටීචර්...

**ටීචර්** - බොහොම හොඳයි... කසුන් එහෙනම් කියන්ඩ බලන්ඩ ඌරො මාරුවෙන තැනට මොකක්ද කියන්නෙ කියල...?

**කසුන්** - පෝක් සමුද්‍ර සන්ධිය ටීචර්...



# English Vision...

*Nota Bene* / සැ.යු :-

මෙම වාක්‍යය රටාව භාවිතා කිරීමේදී පහත උපදෙස් පිළිපැදීම වැදගත් වේ.

- **How about** :- කරමුකෝ ආදී වශයෙන් අර්ථය ලබාගැනීම සඳහා මෙම වාක්‍යය කණ්ඩය කිසිදු වෙනසකින් තොරව වාක්‍යයට භාවිතා කළ හැක.
- **Verb (ing)** :- ක්‍රියා පදය (**ing** ස්වරූපය) පමණක් භාවිතා වේ.
- **Object** :- කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයෙකු හෝ පදයක් වේනම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන/ බහුවචන භේදයකින් තොරව භාවිතා වේ.
- **Rest** :- ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාවලි, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## How about

යම් කිසි ක්‍රියාවක් කිරීමට ආරාධනය කිරීමේදී කරමුකෝ ආදී වශයෙන් එදිනෙදා බස් වහරෙහි භාවිතයෙහි යෙදෙන වාක්‍යය රටාවක් වශයෙන් මෙම වාක්‍ය රටාව හඳුන්වාදිය හැක.

***Fomular*** **- සූත්‍රය**

**How about + Verb (ing) + Object + Rest.**
හව් එබවුට් + වර්බ් (අයිඑන්ජී) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
කරමුකෝ + ක්‍රියාපදය (**ing** ස්වරූපය) + කර්මය + ඉතිරිය.

***Ex*** / උදා :-

1. How about drinking a cup of tea.
   හව් අබවුට් ඩ්‍රින්කින්ග් අ කප් ඔෆ් ටී.
   තේ එකක් බොමුකෝ.
2. How about singing a song.
   හව් අබවුට් සිගින්ග් අ සෝන්ග්.
   සිංදුවක් කියමුකෝ.
3. How about playing cricket.
   හව් අබවුට් ප්ලේයින්ග් ක්‍රිකට්.
   ක්‍රිකට් සෙල්ලම් කරමුකෝ.
4. How about studying English.
   හව් අබවුට් ස්ටඩීන්ග් ඉන්ග්ලිෂ්.
   ඉංග්‍රීසි ඉගෙන ගමුකෝ.
5. How about drinking some water.
   හව් අබවුට් ඩ්‍රිංකිං සම් වෝටර්.
   වතුර ටිකක් බොමුකෝ.

Analysis of the sentence formation
වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේෂණය.

How about + Verb (ing) + Object + Rest.
හව් අබවුට් + වර්බ් (අයිඑන්ජී) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
කරමුකො + ක්‍රියාපදය ( **ing** ස්වරූපය) + කර්මය + ඉතිරිය

How about drinking a cup of tea.
හව් එබවුට් ඩ්‍රින්කින්ග් අ කප් ඔෆ් ටී.
තේ එකක් බොමුකෝ.

ප්‍රායෝගික අභ්‍යාස සඳහා වාක්‍ය නිර්මාණය කර වාක්‍ය රටාවෙහි භාවිතය මැනවින් අවබෝධකර ගනිමු.

***" English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද ඔබට මග හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



කපිතාන් චමින්ද ලියනගේ
ශ්‍රීලසංබ
සංඥා පුහුණු පාසල - බුවැලිකඩ
www.englishvision.lk





# බුහුමන් මැදින් ගෞරවණීය සමුගැන්මක්...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රෙජිමේන්තු සැරයන් මේජර් සෙ/59284 බනි 1 බීඑල්ආර්එස් බුත්පිටිය යූඑස්පී සිය විසි වසරක යුද්ධ හමුදා මෙහෙවර නිමාකර පසුගියදා සිය ධූරයෙන් සමුගන්නා ලදී.

තත් බලලත් නිලධාරිනිය වෙනුවෙන් එම රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙතින් ගෞරවණීය සමුගැනීමේ සාදයක් සංවිධානය කොට තිබුණේ කාන්තා බළකා බළකාධිපතිගේද සහභාගීත්වයෙනි. නික්ම යන බලලත් නිලධාරිනියට "රණවිරුවා" තුළින් අපිද සුබ පතන්නෙමු.

---


රණවිරුවා

පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සැකසුම

සෙ/752158 බනි11 සේනාරත්න ජීසී
3 ඉසේරෙ

සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ
එම්ජීඑම් 11 ඉසේරෙ

සෙ/754676 ලාන්ස් කෝප්‍රල්
ලක්තිලක ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ
මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.



ඊමේල්

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන

011 2993076

යුහ දිගුව

51445/51446



ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම්
අධ්‍යක්ෂ මණ්ඩලය






අධීක්ෂණය

බ්‍රිගේඩියර් එම්පී කරුණාරත්න අයිජී



උපදේශකත්වය

ලුතිනන් කර්නල් ඩීඑම්එම් දිසානායක
ආර්ඩබ්ලිව්පී




ප්‍රධාන සංස්කාරක

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ
ශ්‍රීලංකාපාබලසේනා



සෝදුපත් කියවීම

මේජර් සී ජයවීර ශ්‍රීලසංහ



සහාය සංස්කාරක

කපිතාන් ආර්ඩී ගොඩවිතාරණ ශ්‍රීලයුකාබ

# මින්නේරිය පාබල නිවහනට
# නව පිවිසුම් දොරටුවක්...







යුද්ධ හමුදාවේ "පාබල නිවහන" ලෙස සැලකෙන මින්නේරිය පාබල පුහුණු මධ්‍යස්ථානයේ අභිනවයෙන් ඉදිකළ පිවිසුම් දොරටුව විවෘත කිරීම ඉකුත් සැප්තැම්බර් 24 වන දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් විවෘත කෙරිණ. එම පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උණුසුම් පිළිගැනීම් මධ්‍යයේ එහි සැපත්වූ යුද්ධ හමුදාධිපතිතුමන් පුහුණු පාසල් පරිශ්‍රයේ සංචාරයකද නිරතවෙමින් යෝජිත ගෘහස්ථ ක්‍රීඩා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ද නිරීක්ෂණය කළේය.

2020 ඔක්තෝබර් 222 කලාපය

රණවිරුවා

# විරු හදක දරු සෙනේ...

අවසන් මානුෂීය මෙහෙයුම පැවති සමයේ *LTTE* සංවිධානයෙන් මිදුණු සාමාන්‍ය ජනතාව නිදහස පතා පොදිකමින් රජයේ පාලන ප්‍රදේශවලට පැමිණෙන්නට වූහ. එහිදී රණවිරුවන් ඔවුනට අවශ්‍ය ආරක්ෂාව, රැකවරණය සලසද්දී එසේ පැමිණි පිරිස අතර සිටි අත දරුවන්ට අපගේ විරු සෙබළියන් ධාරක සෙනේ පිරි මව්වරුන් ද වූවාය.




**කිරි කඳුළකට උරුමය අන් සතු කෙරුව**
**නැති බැරිකමින් සිරවුණු ජීවිත දුටුව**
**විරු දියණියණි ළය පුරවා කිරි එරුව**
**සෙනෙහස ගැලුවාද උහුලා ගනු බැරුව**

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.